ක්‍රිස්තුස් වහන්සේගේ

# පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"මක්නිසාද, දෙවියන් වහන්සේ අපේ සිතට වඩා උතුම්ව සියලුදේම දන්නා නිසාය" (1 යොහාන් 3 : 20)

83 වන වෙළුම අංක 03 (975) 2024 මැයි / ජූනි

# දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් අනාගතයට මුහුණදෙන්න

(ඩබ්.සී. මෝරේ විසිනි.)

**"ප්‍රේමවන්තයෙනි, අපේ සිත අපට දෝෂාරෝපණය නොකරනවා නම් දෙවියන් වහන්සේ ඉදිරියෙහි නිර්භීතකම අපට ඇත්තේය. තවද අපි උන්වහන්සේගේ ආඥා රක්ෂා කරමින් උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්න දේ කරන බැවින් අපි උන්වහන්සේගෙන් ඉල්ලන සියල්ල ලබමුව."** (1 යොහාන් 3:21-22) දෙවියන් වහන්සේගේ වචනයෙන් පෝෂණය වෙන්න. **"උන්වහන්සේ උත්තර දෙවින් මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ මුඛයෙන් නික්මෙන සියලු වචනවලින් ජීවත්වෙනවා මිස, රොටී පමණකින් ජීවත්නොවන්නේය කියා ලියා තිබේ යයි කී සේක."** (මතෙව් 4:4) අපගේ ශරීරයට මෙන්ම අපගේ ආත්මයට ද පෝෂණය අවශ්‍ය බව වටහාගන්න. කාලය ගෙන එය වටහාගන්න. දෙවියන් වහන්සේගේ වචනය කියවීමට සහ මෙනෙහි කිරීමට කාලය ගෙන ඔබ උන්වහන්සේගේ කැමැත්ත දැන ගැනීමටත්, උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමටත් එයින් ශක්තිමත්වීමටත් එය ප්‍රයෝජනයට ගන්න.

## අඳුරු කාලයේදීත් දෙවියන් වහන්සේ තුළ විශ්වාසය තබන්න.

ඊසාක් උපදින තුරු ආබ්‍රහම් වසර ගණනාවක් ඇදහිල්ලෙන් බලා සිටියේය. එම නිසා යාච්ඤාවට පිළිතුරු ලැබීම ප්‍රමාද විය හැකි නමුත් නොකඩවා විශ්වාස කිරීමට ඉගෙනගත යුතුය. **"නුඹලා අතරෙන් ස්වාමීන් වහන්සේ කෙරෙහි බය ඇත්තා වූ උන්වහන්සේගේ මෙහෙකරුවාගේ හඬට කීකරුවෙන්නා වූ තැනැත්තා කවුද .. ? ආලෝකය නැතුව අඳුරෙහි ඇවිදින්නා වූ තැනැත්තේ ස්වාමීන් වහන්සේගේ නාමය කෙරෙහි විශ්වාස කර තමාගේ දෙවියන් වහන්සේ කෙරෙහි පිහිටා සිටීවා."** (යෙසායා 50:10)

දාවිත් නිතරම කදු මුදුනේ සිටියාද ... ? පාවුල් නිතරම කරදර සහ දුක්ඛිත දේශයෙන් ඉවත්ව සිටියාද .. ? (ගීතාවලිය සහ 2 කොරින්ති 11:23-33, 12:1-10, පිල්ප්පි 4:13 කියවන්න) දෙවියන් වහන්සේට සහ උන්වහන්සේ අපට දක්වන ප්‍රේමයේ සැබෑ ගැඹුර අප විසින්ම දැනගත හැකිවන්නේ කෙසේද ? උන්වහන්සේ අපව පරීක්ෂාවට ලක්කිරීමට සහ සෝදිසි කිරීමට යොමු කරන සේක්ද ... ? සියළුදේම අපගේ යහපත පිණිස සිදුවන බව දේව වචනයේ සඳහන් වේ. **"තවද දෙවියන් වහන්සේට ප්‍රේමකරන්නන්ට එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබුවන්ට සියලුදේ යහපත පිණිස එකට ක්‍රියාකරන බව අප දනිමුව."** (රෝම 8:28)

2 පිටුවට

**"අධර්මිෂ්ඨකම බෝවන බැවින් බොහෝ දෙනාගේ ප්‍රේමය හීන වන්නේය"** (මතෙව් 24:12) දැන් අධර්මිෂ්ඨකම බහුල වන අතර බොහෝ දෙනාගේ ප්‍රේමය හීන වන බවින් අදහස් කරන්නේ අපගේ ප්‍රේමණීය ස්වාමීන් වහන්සේ කෙරෙහි ඇල්මක් ඇති බොහෝ දෙනා අප අතර සිටිය යුතු බව නොවේ. ඒ වෙනුවට එය අපට සෘජු අභියෝගයක් සහ අනතුරු ඇඟවීමක් වන අතර පෙර නොවූ ආකාරයෙන් දෙවියන් වහන්සේව අල්ලාගෙන සිටීම වෙතට නැඹුරුවීම සහ අඳුරු දේවල් කොපමණ පෙණුනත් නොකඩවා දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබා ගැනීමට යොමුවිය යුතු බව එයින් අදහස් කරන්නේය.

දේව වචනයේ සඳහන් වන අනතුරුදායක කාලවල් (2 තිමෝති 3:1-17) යනු පසු බැසීමට නොව ඉදිරියට යාමට කැඳවනු ලැබීමකි. අද අප මුහුණ දෙන හිෂණයේ, උපද්‍රව සහ අන්තරාදායක දවස් අපට අවස්ථාවක් ලබාදෙන දවස් වේ. ස්වාමී වූ දෙවියන් වහන්සේ මනුෂ්‍යයන් අතරේ සාක්ෂිකරුවන්වීමට අපව කැඳවනු ලබන සේක. **"නුවුන් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹලා කෙරෙහි පැවිණී කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද, මුළු යුදයෙහිද, සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කී සේක. "** (ක්‍රියා 1:8) යේසුස් වහන්සේ මෙසේ කී සේක. **"එසේව මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ග යෙහි සිටින නුඹලාගේ පියාණන් වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා."** (මතවේ 5:16) දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ආලෝකය, උන්වහන්සේ අපව ගලවාගත් උතුම් වූ ගැලවීමේ සහතිකය සහ අප ආදරය කරන සහ විශ්වාස කරන ස්වාමීන් වහ්සේ කෙරෙහි නොසැලෙන භක්තියේ ආලෝකය බියෙන් සහ කළකිරුණ තත්ත්වයේ සිටින මනුෂ්‍යයන් ඉදිරියේ බබලවන්නට ඉඩදෙන්න. එවිට ඔවුන්ද දෙවියන් වහන්සේ වෙතට හැරෙනු ඇත.

## දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම මත පූර්ණ විශ්වාසය තැබීම

මෙම අඳුරු පැයේ දී දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම මත පූර්ණ විශ්වාසය තබා සියලු ගැටළුවලට මුහුණ දෙන්න. ඕනෑම තත්ත්වයක්, ඕනෑම කොන්දේසියක්, ඕනෑම දුෂ්කරතාවයක්, ඕනෑම සම්බන්ධතාවයක්, නොදන්නා වූ, උත්සාහ නොකළ අඳුරු සහ භයානක අවස්ථාවක් හෝ තත්ත්වයක් එකතු කිරීමට දෙවියන් වහන්සේට අපහසු නැත. උන්වහන්සේ සියලු දේ දන්නා සේක. ( 1 යොහාන් 3:20) තවද උන්වහන්සේ අප ගැන සැලකිලිමත්ව සිටින සේක. (1 ප්‍රේතුස් 5:7) දෙවියන් වහන්සේට කිසිවක් අපහසු නැත. (යෙරමියා 32:17) දෙවියන් වහන්සේට සියල්ල කළ හැකිය. (මතෙව් 19:26)

මුහුණ දෙන්නා වූ දුෂ්කර වූ වාතාවරණයන්, ව්‍යාකූල බාධාවන්, මුරණ්ඩු (හිතුවක්කාර) අවහිරතාවයන්, වේදනාත්මක සෝදිසි කිරීම්, මහත් වෙහෙසට පත්වන ඉල්ලීම් සහ මහත් විශාල වගකීම්වලදී වෙවුලමින් සහ බියෙන් බලා සිටින්නේ නැතිව ඒ වෙනුවට ප්‍රීතිවෙන්න. දෙවියන් වහන්සේ ඒ සියල්ලට වඩා විශාලව සිටින අතර උන්වහන්සේ අප ප්‍රේම කරමින් අපි සැම විටම උන්වහන්සේව විශ්වාස කරනවාට සහ උන්වන්සේට කීකරු වෙනවාට ආශාවෙන් සිටින සේක. ඔබ මුහුණ දෙන ඕනෑම ප්‍රශ්නයකට වඩා දෙවියන් වහන්සේ උතුම්ව සිටින සේක. දුෂ්කර තත්ත්වයන්ට මුහුණ දෙන විටදී දෙවියන් වහන්සේ අපෙන් වෙන්ව ගොස් අප හැර ගියා සේ, උන්වහන්සේගේ ප්‍රඥාව, සර්වබලධාරීත්වය නැතිවූවාසේ උන්වහන්සේ අපගේ විශ්වාසවන්ත මැවුම්කරුවාණන් නොවුවාක් මෙන් කිසි විටෙක බියෙන් යුතු සිතින් හෝ කල්පනාවෙන් ඒවාට මුහණ නොදෙන්න. උන්වහන්සේගේ ප්‍රේමයනේ උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් දීමෙන් උන්වහන්සේගේ අනුකම්පාව දැනටමත් අප කෙරෙහි දක්වා ඇත. (1 ප්‍රේතුස් 4:12-19, රෝම 8:26-39) එය දෙවියන් වහන්සේට උන්වහන්සේගේ විශ්වාසවන්තකම සහ උන්වහන්සේගේ අස්වභාවික බලය තවදුරටත් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදෙන නිසා අපි දුෂ්කර දේවලට උද්යෝගයෙන් යුතුව මුණ දෙමු. හාලේලූයියා, "නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා සියල්ලෙහිදී ස්තුතිදීම සමඟ යාච්ඤාවෙන්ද, කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන් වහන්සේට දන්වාපල්ලා." (පිලිප්පි 4:6)

## නිවැරදිව (සැබෑ ලෙස) ජීවත්වෙන්න.

සැමවිටම අපට උපකාරය ලැබෙන පිණිස උන්වහන්සේගේ වචනයට අනුව අපගේ ජීවිත උන්වහන්සේගේ කැමැත්තට ඉඩ හැර තිබෙන බව සහතිකර කර ගනිමු. අපි පාපයේ ජීවත් නොවන බවටත් , දෙවියන් වහන්සේගේ වචනය විශ්වාස නොකිරීමෙන් දෙවියන් වහන්සේට දුක් නොදීමටත්, අනිත් කිතුනුවන්ව විවේචනය කිරීම, නොසැලකිලිමත්කම, තමාවම සතුටුකර ගැනීම, වංචාව, අන් අයට වෛරකිරීම, දන්නා වූ රාජකාරි නොසලකා හැරීම, හෝ අකීකරුකමේ වෙනත් පාපයන්ට ගොදුරු නොවීමටත් වගබලා ගනිමු.

1 පිටුවෙන්

# දෙවියන් වහන්සේ කෙරෙහි..

දෙවියන් වහන්සේව සතුටු කරන, උන්වහන්සේ කෙරෙහි ළදරුවෙක් මෙන් ඇති ඒ සාමාන්‍ය විශ්වාසය අපගේ හදවත් තුළ තිබීම ගැන මම සිතමින් සිටියෙමි. ඇදහිල්ල ඇතිකර ගැනීම ඉතා අපහසුය. ඉක්මනින්ම විශ්වාස කිරීම ඉතා අපහසුය කියා මම සිතමින් සිටියෙමි. ඒ මොහොත්ම දෙවියන් වහන්සේ මගේ හදවතට කථා කල සේක. එය විශ්වාස කිරීම අපහසු නැත. ළදරුවෙකුට වුවත් එය විශ්වාස කළ හැකිය. ඔබ විශ්වාස කිරීමට සිතිය යුතු නැත. කියා උන්වහන්සේ පැවසූ සේක. වසර ගණනාවක් පුරා එය මට ශක්තියක් සහ ධෛර්යයක් ගෙනදුන්නේය. **"නුඹේව නුවණෙහි නොපිහිටා නුඹේ මුළු සිතින් ස්වාමීන් වහන්සේ කෙරෙහි විශ්වාස කරපන්න."** (හිතෝපදේශ 3:5) අපි මෙම වචනය පිළිපදින අතර අපගේ මුළු හදවතින්ම ස්වාමීන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන විට, කරදරවීමට, බියවීමට, අපගේ හදවතේ ඉඩක් ඉතුරු නොවේ. අපගේම දැනගැන්මෙහි පිහිටා නොසිටීමට ඉගෙන ගනිමු. සැකයට හෝ බියට ඉඩක් නොතබමු. සාතන්ට අවනතවීම ප්‍රතික්ෂේප කරමු. සාතන්ට ඉඩ නොදෙමු. (යාකොබ් 4:7-8, එපීස 4:27)

## කුණාටු වළාකුළු මත දේදුන්න දකින්න

දෙවියන් වහන්සේ ආශ්චර්යමත් දේ කරන දේවියන් වහන්සේය. උන්වහන්සේගේ මාර්ග අපේ මාර්ග නොවේය. (යෙසායා 55:8-13) දෙවියන් වහන්සේ ආබ්‍රහම්ව පුත්‍රයෙක් සහ උරුමක්කාරයෙක් ලබාදෙන බවට වූ පොරොන්දුව සැබවින්ම ඉටු කළ සේක. නමුත් ඊසාක් උපත ලැබුවේ ආබ්‍රහම් වයස්ගත වූ විටදීය. ("මළ කෙනෙකු මෙන් වූ විටදීය.") (හෙබ්‍රෙව් 11:8-12) දෙවියන් වහන්සේ ආශ්චර්යමත් ක්‍රියාවන් කරමින් සිටි උන්වහන්සේගේ පුත්‍රයාණන්ව සොරුන් දෙදෙනෙකු මැද කුරුසියේ ඇණගසන ලැබූ විට උන්වහන්සේගේ ගෝලයන් බියෙන් සැඟවී විසිර ගියෝය. එම පැය මධ්‍යම රාත්‍රියේ ඇඳුරු හෝරාවක් මෙන් සහ වචනයෙන් විස්තර ක නොහැකි තරම් පරාජයක් මෙන් යේසුස් වහන්සේගේ අනුගාමිකයන්ට පෙණුනත් ඉන් දවස් පනහකට පසුව මහා පිඹීදීමකින් යුක්තව පෙන්තකොස්ත දවස ඔවුන් ඉදිරියට පැමිණියේය.

අද අපි ජීවත්වන්නේ ක්ලවාරියේ සිට පෘතුවියේ අඳුරුම පැයවලින් එකක වුවද ඊශ්‍රායෙලය උන්වහන්සේගේ අනුග්‍රහයට බද්ධ කිරීමට පෙර දෙවියන් වහන්සේ තවත් බලවත් පෙන්තකොස්තයක් එවා අන්‍යජාතීන් අතරෙන් විශාල සෙනඟත් ගලවා ගන්නා බව අපි විශ්වාස කරන්නෙමු. (රෝම 11:1-32) අපි අපගේ මුහුණු දෙවියන් වහන්සේ වෙතට හරවා ගනිමු. (දානියෙල් 9:3) දෙවියන් වහන්සේව අල්ලා ගැනීමට අපවම උද්යෝගිමත් කර ගනිමු. (යෙසායා 64:7) දෙවියන් වහන්සේ පැමිණ ධර්මිෂ්ඨකමේ වර්ෂාව අප වෙත වස්වන තෙක් අපි යාච්ඤා කරමු. (හොෂෙයා 10:12)

# අප උදෙසා ස්වාමීන් වහන්සේගේ පුද්ගලික ප්‍රේමය සහ සැලකිල්ල

(රිවි කාර්මයිකල් විසිනි.)

මැතකදී මම බොහෝ කරදර මැද ස්වාමීන් වහන්සේව සෙවූ විට උන්වහ්නසේ අප ගැන කොයිතරම් සැලකිල්ලක් දක්වනවාද .. ? උන්වහන්සේ කොයිතරම් අප සමඟ සිටිනවාද .. ? අපට උපකාර කිරීමට උන්වහන්සේට කොපමණ හැකියාවක් තිබෙනවාද ..? අප සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට කොයිතරම් ආශාවක් දක්වනවාද යන්න මට මතක් කර දීමට උන්වහන්සේ කරුණාවන්ත වූ සේක. වචනයෙන් කියනවා නම් උන්වහන්සේ අප කෙරෙහි පුද්ගලිකව කොපමණ සැලකිල්ලක් දක්වනවාද කියා මට මතක් කර දුන් සේක. සරල නමුත් මෙම ගැඹුරු සත්‍යතාවය මට ගෙන ආවේ සහ ගෙනඑන්නේ කොයිතරම් මහත් දිරිගැන්වීමක් සහ සැනසීමක් ද .. ? එය පුද්ගලිකව වඩා වැඩියෙන් උන්වහන්සේට ප්‍රතිචාරය දැක්වීමට මාව පොළඹවනු ලබන්නේය. ඔබත් ඒ හා සමානව ආශිර්වාද ලබන පිණිස ස්වාමීන් වහන්සේගේ හදවත අප කෙරෙහි දක්වන ලෙසත් අපට උන්වහන්සේට වඩා පූර්ණ ලෙස ප්‍රතිචාරය දැක්විය හැක්කේ කෙසේද යන්නත් සලකා බලන ලෙස මම ඔබට ආරාධනා කරමි.

## අපි උන්වහන්සේගේ විශේෂ වූ මැවිල්ලයි.

පළමුව අපගේ පැවැත්ම උන්වහන්සේගේ පුද්ගලික උනන්දුව සහ අප කෙරෙහි ඇති ප්‍රේමය පිළිබඳ සාක්ෂියකි. අපි මෙහි සිටින්නේ උන්වහන්සේගේ සැලැස්මට අනුව වන අතර අපි සෑම කෙනෙක්ම උන්වහන්සේගේ අත්වල වැඩවන සේක. **"ඔක්නිසාද ඔබ මාගේ හදවත නිර්මාණ ගත්සේක. මාගේ මව් කුසෙහි මා වැසූසේක."** (ගීතාවලිය 139:13) අපි උන්වහන්සේගේ විශේෂ වූ මැවිල්ලයි. උන්වහන්සේගේ ස්වරූපයෙන් හා සමානත්වයෙන් ඉතා පුද්ගලික ආකාරයෙන් අපව සාදනු ලැබූ සේක. (උත්පත්ති 1:26-27) අප පිළිසිඳගත් දා සිට (ඊට පෙර දී පවා) අපව හඳුණන අතර අපගේ ජීවිත සහ තත්ත්වයන් පිළිබඳව සෑම විස්තරයක්ම උන්වහන්සේ දන්නා සේක. (ගීතාවලිය 139:1-24) උන්වහන්සේගේ දෑස් අප දෙස යොමු කරමින් අප දෙස බලා සිටින අතර උන්වහන්සේ අප ගැන ගැඹුරින් සැලකිලිමත් වේ. ( 1 ප්‍රේතුස් 3:12, 5:7)

## අපි දෙවියන් වහන්සේව හඳුනාගැනීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක

දෙවියන් වහන්සේගේ උතුම් වූ ආශාව වන්නේ අපි උන්වහන්සේව දැන හඳුනාගෙන උන්වන්සේ සමඟ මිත්‍රත්වයක් ඇතිකර ගැනීම බවද සලකන්න. **"සදාකාල ජීවනය නම් මේය, එකම සැබෑවූ දෙවියන් වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් අඳිනගැනීමය".** (යොහාන් 17:3) දෙවියන් වහන්සේව සහ උන්වහන්සේගේ මුහුණ සෙවීමට අපව කැඳවන අතර අපගේ මුළු හදවතින්ම සහ අපගේ මුළු ආත්මයෙන්ම උන්වහන්සේව සොයන්නේ නම් අපට උන්වහන්සේව මුණගැසෙන බවට පොරොන්දු වූ සේක. (ද්විතිය කථාව 4:29) අපි උන්වහන්සේට ළංවන විට උන්වහන්සේ අපට ළංවන සේක. (යාකොබ් 4:8) ආරම්භයේ සිටම උන්වහන්සේගේ ආශාව වූයේ ආදම් සහ ඒව පාපයට වැටීමට පෙර ඒදන් උයනේදී කළාක් මෙන් අපි උන්වහන්සේව හඳුනාගෙන උන්වහන්සේගේ පැමිණීම භුක්තිවිඳිමයි. නව ගිවිසුමේ සැලැස්ම ඇතුළුව උන්වහන්සේගේ හදවතේ ඇති මෙම ආශාව පිළිබඳව බයිබලය පුරාම දකින්නට ලැබේ. **"එසේය, ඒ දවස්වලට පසු මා විසින් ඊශ්‍රායෙල් වංශය සමඟ කරන ගිවිසුම නම් මාගේ ව්‍යවස්ථා ඔවුන්ගේ සිතියේ තමින් ඒවා ඔවුන්ගේ සිත්වලද ලියන්නෙමි. මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි. ඔවුහු ද මාගේ සෙනඟක් වන්නෝය. ස්වාමීන් වහන්සේ ඇඳිනගනින්න කියා එකිනෙකා තමතමාගේ නුවර වැසියාටත්, සහෝදරයාට, නුගන්වන්නේය. ඔක්නිසාද ඔවුන්ගෙන් කුඩා අය පටන් ලොකු අය දක්වා සියල්ලෝම මා ඇඳිගන්නේය. "** (හෙබ්‍රෙව් 8:10-11)

## උන්වහන්සේගේ ප්‍රේමය, සැලකිල්ල සහ අභිමුඛත්වය

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය අප වෙත වගුරුවන බව බයිබලයේ පවසයි. (රෝම 5:5) ඒමෙන්ම අපගේ මුළු හදවතින් මුළු ආත්මයෙන්, මුළු ශක්තියෙන් , මුළු බුද්ධියෙන්, උන්වහන්සේට ප්‍රේම කිරීමට අපව කැඳවා තිබෙන සේක. (මාර්ක් 12:30) වෙනත් ආකාරයකින් දාවිත් පවසන්නේ උන්වහන්සේ අපට ප්‍රේම කරන අතර අපි උන්වහන්සේගේ ප්‍රේමයට ප්‍රතිචාරය දක්වමින් ක්‍රියා කළ යුතු බවයි. මක්නිසාද දාවිත් දෙවියන් වහ්සේගේ සිතට එකඟ වූ මනුෂ්‍යයෙක් විය. (1 සාමුවෙල් 13:14) එම හදවතේ අඩුවක් ඇති සෑම අවස්ථාවකම උන්වහන්සේ සැලකිලිමත් වන සේක. **"නුවුන් නුඹ පළමු ප්‍රේමය අත්හැරියෙහිය යන කාරණය නුඹට විරුද්ධව මට ඇත්තේය."** (එළිදරව් 2:4) ඇත්ත වශයෙන්ම. දෙවියන් වහන්සේ අප කෙරෙහි කොයිතරම් සැලකිල්ලක් දක්වනවාද යන්නත් උන්වහන්සේ අප සමඟ සිට අපට උපකාර කරන්නේ කෙසේද යන්නත්, උන්වහන්සේගේ වචනය තුළ නැවත නැවතත් පෙන්වාදෙන සේක. පහත සඳහන් උදාහරණ කිහිපය තුළ උන්වහන්සේගේ පුද්ගලික මැදිහත්වීම සැලකිල්ලට ගන්න.

**"බය නොවන්න, ඔක්නිසාද මම නුඹ සමඟ සිටිමි. තැති නොගනින්න, ඔක්නිසාද මම නුඹේ දෙවියන් වහන්සේය. මම නුඹ ශක්තිමත්කොට නුඹට උපකාර කරන්නෙමි. එසේය මාගේ ධර්මිෂ්ඨකම නැවති දකුණතින් නුඹ උසුලන්නෙමි. "**(යෙසායා 41:10)

"මහළු වයස දක්වාත් මම එසේමය. හිස පැසීම දක්වාත් මම නුඹලා උසුලන්නෙමි. මම සැදීමි. මමම නුඹලා දරාගෙන, මමම උසුලාගෙන ගලවන්නෙමි. " (යොසයා 46:4)

"ධර්මිෂ්ඨයෝ මොරගැසුවෝය. ස්වාමීන් වහන්සේ අසා ඔවුන්ගේ සියලු දුක් වලින් ඔවුන් ගැලවූ සේක. ස්වාමීන් වහන්සේ බිදුණු සිත් ඇත්තන්ට ළංව සිටින සේක. තැළුණු ආත්ම ඇත්තන් ගලවන සේක." (ගීතාවලිය 34 : 17-18 )

"සදාකාල දෙවියන් වහන්සේ නුඹේ වාසස්ථානයය. යටින් සදාකාල හස්තයෝ නුඹ දරා සිටින්නෝය. නුඹ ඉදිරියෙන් උන්වහන්සේ සතුරන් පන්නාදමා ඔවුන් විසින් විනාශ කරවයි කී සේක." (ද්විතිය කථාව 33:27)

3 පිටුවට

2 පිටුවෙන්

# අප උදෙසා ස්වාමීන්...

## විශේෂ වූ සම්බන්ධතාවය

උන්වහන්සේ අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ බවත් අපි උන්වහන්සේගේ පුත්‍රයන් සහ දූවරුන් බවත් අනාවරණය කර තිබෙන ආකාරය බලන්න. **"අපි දෙවියන් වහන්සේගේ දරුවෝ යයි කියනු ලබන ලෙස පියාණන් වහන්සේ කෙබඳු ප්‍රේමයක් අපට දී වදාළ සේක්දැයි බලාපල්ලා. අපි එබඳුවෝමය. වේ නිසා ලෝකයා නඳින්න බැවින් අපද අඳුන්නේ නැත."** (1 යොහාන් 3:1) එය කොයිතරම් අනර්ඝද ? දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ ආත්මයාණන් වහන්සේව අපගේ හදවත් තුළට වගුරුවා තිබෙන සේක. එබැවින් අපට අබ්බා පියාණෙනි කයා මොර ගැසිය හැකිය. (ගලාති 4:6) අපගේ මිත්‍රත්වය (පංගුකාරකම) පියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ හා සමඟය. (1 යොහාන් 1:3)

අපගේ පියාණන් වහන්සේට අප එකිනෙකා සමඟ කාලය ගතකිරීමට අවශ්‍යව තිබෙන සේක. එම නිසා උන්වහන්සේ සමඟ පුද්ගලිකව යාච්ඤාවෙන් සම්බන්ධවීමට කැඳවන සේක. **" නුඹුත් නුඹ යාච්ඤා කරන කල්හි නුඹේ අත්‍යල්ගෙට වැද, දොර වසා රහසිගතව වසන නුඹේ පියාණන් වහන්සේට යාච්ඤා කරපන්න. එවිට රහසින් දකින නුඹේ පියාණන් වහන්සේ නුඹට විපාක දෙන සේක."** (මතෙව් 6:6) උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සොයන විට අපගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා උන්වහන්සේ අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ ලෙසට අපට උන්වහන්සේ මත යැපීමට හැකිය. (මතෙව් 6:31-33) අපි ඉල්ලන විට සියලු යහපත් දීමනා සහ ශුද්ධාත්මයාණන් වහන්සේව අපට ලබාදෙන සේක. (මතෙව් 7:11, ලුක් 11:13) ඒ අතරම අපගේ පියාණන් වහන්සේ මත යැපීමටත් හැකිය. අවශ්‍යය වූ විට අපට තරවටු කරන්නේ උන්වහන්සේ අප ගැන දක්වන සැලකිල්ල නිසාය. (හෙබ්‍රෙව් 12:5-11) පරණ ගිවිසුමේදී දෙවියන් වහන්සේ තම සෙනඟ සමඟ ඇති සම්බන්ධතාවය විස්තර කිරීමට විවාහයේ පුද්ගලික ස්වභාවය ද භාවිතා කරන සේක. (යෙසායා 54:5, යෙරමියා 31:32) තවද උන්වහන්සේ තම සෙනඟ තමන් වහන්සේ කෙරෙහි දක්වන ද්‍රෝහිකම අනාචාරය ලෙස සඳහන් කරන සේක. (යෙරමියා 3:32) ක්‍රිස්තුස් වහන්සේට උන්වහන්සේගේ මනාලිය අතර ඇති සම්බන්ධතාවයට වඩා පුද්ගලික විය හැක්කේ කුමක්ද ?

## පාපය මේ ගිවිසුමේ සම්බන්ධතාවයන් උල්ලංඝනය කරන්නේය

ස්වාමීන් වහන්සේ පාපය ඉතා පුද්ගලික කාරණයක් ලෙස සලකන සේක. මක්නිසාද එය උන්වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවය උල්ලංඝනය කිරීමකි. අපගේ අයුතුකම් අපව උන්වහන්සේගෙන් වෙන්කර උන්වහන්සේගේ මුහුණ අපෙන් සඟවයි. (යෙසායා 59:2) අපගේ පාපය ශුද්ධාත්මයාණන් වහන්සේට දුක්දීමකි. (එපීස 4:30) දාවිත් නැවතත් දෙවියන් වහන්සේගේ හදවතට එකඟ වූ මනුෂ්‍යයෙකි. මනුෂ්‍යයෙකුට දෙවියන් වහන්සේ සමඟ ඇති පුද්ගලික සම්බන්ධතාවයට පාපයේ ඇති බලපෑම ඔහු අවබෝධ කරගත්තේය. නාතාන් අනාගතවක්තෘ බාත්ෂෙබා සමඟ දාවිත් කළ පාපය පෙන්වා දුන් අතර එයට මුහුණදීමෙන් පසු දාවිත් දැඩි වේදනාවට පත් වූ කාරණය වූයේ ඔහුගේ පාපය දෙවියන් වහන්සේ සමඟ ඇති පුද්ගලික සම්බන්ධතාවය කොයිතරම් අවදානමට ලක්වූවාද කියා ඔහු දැන සිටි බැවිනි. **"ඛඨට විරුද්ධව, ඛඨට පවණක් විරුද්ධව, පව් කළෙවි. ඛඨගේ ඇස් හමුයෙහි නපුරුවු නිඛෙන දේ කළෙවි. එඛැවින් ඛඨ කථාකරන කළ සාධාරණ සේක. විනිශ්චය කරන කළ ඛඨ ශුද්ධ සේක."** (ගීතාවලිය 51:4) **"ඛඨ ඉඳිරියෙන් මා ඩැහැර නොකළ මැනව,**

**ඛඨගේ ශුද්ධාත්මය මාගෙන් පහ නොකළ මැනව."** (ගීතාවලිය 51:11) දෙවියන් වහන්සේ පුද්ගලිකව මෙම කාරණය පිළිසකර කළ හැකි වන්නා වූ යතුර කුමක්දැයි පුද්ගලිකවම දැන සිටියේය. "දෙවියන් වහන්සේට කළ යුතු පූජා නම් බිඳුණා වූ සිතක්ය. දෙවියන් වහන්ස, බිදුණාවූ තැළුණා වූ සිතක් ඔබ සුළුකොට නොසිතන සේක." (ගීතාවලිය 51:17)

## උන්වහන්සේගේ ආදරයට වඩා වැඩි ආදරයක් නැත

තරුණ අවධියේදී එඩේර ළමයෙක් වූ දාවිත් ස්වාමීන් වහන්සේ අපගේ එඩේරාය යන අලංකාර සත්‍යතාවය දැන සිටියේය. මෙයද උන්වහන්සේ අප සමඟ පුද්ගලිකව සම්බන්ධතාවය ඇතිකරගන්නා ආකාරය ගැන අනාවරණය කිරීමට උපකාරීවේ. **" ස්වාමීන් වහන්සේ, දෙවියන් වහන්සේ ඔබ දැනගනිව්, උන්වහන්සේ අප මැවූ සේක. අපි උන්වහන්සේගේය."** (ගීතාවලිය 100:3) උන්වහන්සේ අපට මඟ පෙන්වන සේක. අපව නැවත ගොඩනගන සේක. අපව සනසන සේක. අපට කෑම මේසයක් පිළියෙල කරන සේක. අපව ආලේප කරන සේක. (ගීතාවලිය 23:1-6) උන්වහන්සේ බැටළුවෙකු නැති වූ විට ඌ පසු පස යන අතර උන්වහන්සේ ඌ සොයාගත් විට ...., **"නුඹලා අතරෙන් බැටළුවන් සියයක් ඇති කවර මනුෂ්‍යයෙක් නමුත් උන්ගෙන් එකෙක් නැතිවුණොත්, එකුන් සියය වනයේ අතහැර, නැති වූ එකා පස්සේ ගොස් ඌ සම්බ වෙන තුරු නොසොයන්නේද ... ? ඌ සම්බ වූ විට ඔහු ප්‍රීතිවෙවින්, ඌ තමාගේ කරේ තබාගෙන ගෙදර ඇවිත් මිත්‍රයන්ද, අසල්වාසන්ද, කැඳවා මා සමඟ ප්‍රීතිවෙයල්ලා. එක්නිසාද මාගේ නැති වූ බැටළුවා සම්බවී යයි ඔවුන්ට කියයි."** (ලුක් 15:4-6) උන්වහන්සේ තම බැටළුවන් හඳුණන සේක. බැටළුවන්ද උන්වහන්සේව හඳුණන්නෝය. අවසානයේ දී උන්වහන්සේ ඔවුන් වෙනුවෙන් තම ජීවිතය පූජා කරන සේක. (යොහාන් 10:14-15)

ස්වාමීන් වහන්සේ අප සමඟ ඇති උන්වහන්සේගේ සම්බන්ධතාවය පුද්ගලිකව පවත්වාගන්නා වූ ආකාරය පිළිබඳව ශ්‍රේෂ්ඨතම ප්‍රකාශය උන්වහන්සේ අපට ප්‍රේමකරන සේක අප කෙරෙහි ඇති උන්වහන්සේගේ ප්‍රේමය නිසා උන්වහන්සේට දිය හැකි ප්‍රේමණීය ත්‍යාගය වන උන්වහන්සේගේ ජීවිතය දුන් සේක. **"එක්නිසාද දෙවියන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය."** (යොහාන් 3:16) **"ක්‍රිස්තුස් වහන්සේ නුඹලාට ප්‍රේමකොට විහිරි සුවඳක් පිණිස දෙවියන් වහන්සේට පූජාවක්ද, යාගයක් ද කොට අප වෙනුවට තමන්ම පාවා දුන්නාක් මෙන්ම නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා."** (එපීස 5:2)

## යේසුස් වහන්සේගේ ආදර්ශය

සැබවින්ම ඒ වන විටත් යේසුස් වහන්සේ තම පියාණන් වහන්සේට තමන් වහන්සේගේ ජීවිතය ලබා දී තිබුණු සේක. එය ඉතා පුද්ගලික ක්‍රියාවකි. උන්වහන්සේ ලෝකයට පැමිණි කළ උන්වහන්සේ මෙසේ පැවසූ සේක. **"එහෙයින් උන්වහන්සේ ලෝකයට එන කළ, කථාකර ඔබ පූජාවටත් පතුරටත් කැමති නොවී ශරීරයක් මට සූදානම්කර දුන් සේක. මුළු දවන පූජාවලටත්, පාප පූජාවලටත් ඔබ ප්‍රසන්න නොවූසේක. එවිට මම කතාකොට, දෙවියන් වහන්ස, මෙන්න, (පොත් කාණ්ඩයේ මා ගැන ලියා තිබෙන ලෙස) ඔබගේ කැමැත්ත කරන්ට මම ඇවිත් සිටිමියි කී සේක."** (හෙබ්‍රෙව් 10 : 5-7)

යේසුස් වහන්සේට ජීවිතයට සෑම විටම පුද්ගලික කාරණයක් වූ සේක. උන්වහන්සේගේ පියාණන් වහන්සේ සමඟ උන්වහන්සේට තිබූ සම්බන්ධතාවය පෞද්ගලික එකක් වූ අතර එබැවින් යේසුස් වහන්සේ පියාණන් වහන්සේට ගෞරව කළ සේක. යාච්ඤාවෙන් බොහෝ කාලයක් සම්බන්ධතාවය පැවැත් වූ සේක. කුරුසියේ මරණය දක්වා පියාණන් වහන්සේට කීකරු වූ සේක. යේසුස් වහන්සේට අනිත් අය සමඟ ඇති සම්බන්ධතාවය ද ඉතා පුද්ගලික වේ. යේසුස් වහන්සේ බොහෝ සෙනඟ සමඟ කාලය ගත කළ සේක. පුද්ගලිකවම ඔවුන්ගේ අවශ්‍යතාවයන් ගැන සැලකූ සේක. සමාරියේ ස්ත්‍රිය වෙනුවෙන් උන්වහන්සේ කාලය වැය කිරීම ගැන සිතා බලන්න. (යොහාන් 4:5 සිට) මහලේ රෝගී ස්ත්‍රිය උන්වහන්සේගේ වස්ත්‍රවලට අතගැසුවාය. (මාර්ක් 5:25-34) සාකෙවුස් (ලුක් 19:2-10) එමෙන්ම තවත් බොහෝදෙනා ඉතා සමීපයෙන් මුණුගැසුණු සේක. උන්වහන්සේගේ ප්‍රේමය උතුරා ගලා යන සේක. එමෙන්ම අනුකම්පාවක් දක්වන සේක. උන්වහන්සේගේ සිත සහ ආත්මය අනිත් අය තුළට වගුරුවා අප වෙනුවෙන් ක්‍රියා කරන සේක. ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවෙන් දක්වන ප්‍රේමයේ දිග, පළල, උස ගැඹුර තේරුම්ගත නොහැකි තරම්ය. (එපීස 3:17-19) උන්වහන්සේ අපගේ දුර්වලකම් ගැන අනුකම්පා කරන අපේ උත්තම පූජකයා වන අතර අප වෙනුවෙන් මැදහත්කාරකම් කිරීමට උන්වහන්සේ ජීවමානව සිටින සේක. (හෙබ්‍රෙව් 4:15, 7:25) තවද උන්වහන්සේ සෑමවිටම මෙම ආරාධනය කරන සේක. "වෙහෙස වෙන්නාවූ, බර උසුලන්නා වූ, සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා. මම නුඹළාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන මාගෙන් ඉගෙනගනිල්ලා. එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලු යයි කී සේක." (මතෙව් 11:28-30)

## දේව දරුවන්ට පීඩා කිරීම උන්වහන්සේට පීඩා කිරීම මෙන් සලකන සේක

අපගේ සේවය ස්වාමීන් වහන්සේට අතිශය පුද්ගලික කාරණයක් වන්නේ කෙසේදැයි අවසාන වශයෙන් සලකා බලන්න. **"මක්නිසාද නුඹලාගේ වැඩයද, නුඹලා ශුද්ධවන්තයන්ට කළා වූ කරන්නා වූ උපස්ථානයෙන් දෙවියන් වහන්සේගේ නාමයට පෙන්නූ ප්‍රේමයද මතක නැති කරන්ට උන්වහන්සේ අධර්මිෂ්ඨ නැත."** (හෙබ්‍රෙව් 6:10) ඒ හා සමානව යේසුස් වහන්සේ තම බැටළුවන්ට මෙසේ පවසන සේක. **"මක්නිසාද මම බඩගිනිව සිටියෙවි. නුඹලා මට කන්ට දුන්නහුය. පිපාසිතව සිටියෙවි. නුඹලා මට බොන්ට දුන්නහුය. ආගන්තුකව සටියෙවි. නුඹලාට මා පිළිගත්තහුය. වස්ත්‍ර නැතුව සිටියෙවි. නුඹලා මට ඇඳුම් දුන්නහුය. රෝගාතුරව සිටියෙවි. නුඹලා මා බලන්ට ආවහුය. සිරගෙයි සිටියෙවි. නුඹලා මා වෙතට ආවහුයයි කියන සේක."** (මතෙව් 25 :35-36) ඔවුන් උන්වහන්සේ වෙනුවෙන් මේ දේවල් කවදා කළේ දැයි ප්‍රශ්න කරන විට උන්වහන්සේ පිළිතුරු දෙන්නේ .., **"එවිට රජ්ජුරුවෝ උත්තර දෙවින්, සැබැවක්**

4 පිටුවට

3 පිටුවෙන්

# අප උදෙසා ස්වාමීන්...

**නුඹලාට කියමි. මාගේ වේ සහෝදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකුට නවුත් නුඹලා ඒක කළහුදු එක කළේ මට යයි කියන සේක.”** (මතෙව් 25:40) යේසුස් වහන්සේ තම සෙනගට පීඩා කරන අයට එරෙහිව ඉතා පුද්ගලිකව විරුද්ධව සිටින සේක. දමස්කයට යන පාරේදී සාවුල්ගෙන් උන්වහන්සේ ඇසූ ප්‍රශ්නය සලකා බලන්න. **“ඛහු බිම වැටුණේය. එවිට සාවුල් .., සාවුල් .. නුඹ මට පිඩා කරන්නේ මක්නිසාදැයි තමාට කියන හඬක් ඛහුට ඇසුණේය. ස්වාමීනී.., ඛබ කවුදැයි ඛහු ඇසීය.”** (ක්‍රියා 9:4)

## අපගේ ප්‍රතිචාරය

ඇත්ත වශයෙන්ම, දළ වශයෙන් කරන ලද මෙම විශ්ලේෂණයට තවත් බොහෝ දේ එකතු කළ හැකිය. නමුත් ස්වාමීන් වහන්සේ අප කෙරෙහි දක්වන ඉමහත් ප්‍රේමයට සහ පෞද්ගලිකව ප්‍රතිචාරය දැක්විය හැකි දේ මා සමඟ දැන් සලකා බලන්න.

ඔබගේ මුළු හදවතින්, මුළු ආත්මයෙන්, මුළු ශක්තියෙන්, මුළු බුද්ධියෙන්, උන්වහන්සේට ප්‍රේමකරන්න. **“යේසුස් වහන්සේ ඛහුට උත්තර දෙමින්, යමෙක් මට ප්‍රේමකරන්නේ නම්, ඛහු මාගේ වචනය රක්ෂා කරන්නේය. මාගේ පියාණන් වහන්සේ ද ඛහුට ප්‍රේම කරන සේක. අපි ඛහු ළඟට ඇවිත් ඛහු සමඟ වාසය කරවුව.”** (යොහාන් 14:23)

උන්වහන්සේ සමඟ යාච්ඤාවෙන් කාලය ගතකරන්න. යාච්ඤා කිරීම ප්‍රථමයෙන්ම උන්වහන්සේ සමඟ පංගුකාරත්වයේ සහ සහයෝගීතාවයේ කාලය ලෙස දකින්න. **“නිශ්චලව සිට උන්වහන්සේ දෙවියන් වහන්සේ බව අවබෝධ කර ගැනීමට කාලය ගන්න. නිශ්චලවව්, මා දෙවියන් වහන්සේ බව දැනග නිව්. ජාතීන් අතරේ උසස්වන්නෙමි. පොළොවෙහි උසස් වන්නෙමි.”** (ගීතාවලිය 46:10) **“නපුරු හෘදය සාක්ෂියකින් පිරිසිදුවීම පිණිස අපගේ සිත් ඉසිනු ලැබ, අපේ ශරීරය පිරිසිදු වතුරෙන් සෝදිසි කරනු ලැබ සැබෑවූ සිතක් ඇතිව ඇදීමේ නිසැකකමින් ළඟාවෙමු. අපේ බලාපොරොත්තුවේ ප්‍රකාශ කිරීම වංචල නොවන පිණිස එය තදින් අල්ලාගෙන සිටිමු. මක්නිසාද පොරොන්දුව දුන් තැනැත්තේ විශ්වාසව සිටින සේක.”** (හෙබ්‍රෙව් 10:22-23) මරියා මෙන් අවධානය වෙනතකට යොමු කිරීම පසෙක තබා යේසුස් වහන්සේගේ පාමුල හිඳ උන්වහන්සේට සවන් දෙන්න. (ලූක් 10:38-42)

උන්වහන්සේගේ වචනය වැළඳගන්න. උන්වහන්සේගේ වචනය නිධානය ලෙස හඳුනාග න්න. එය උන්වහන්සේව, උන්වහන්සේගේ ආදරය, උන්වහන්සේගේ අරමුණු සහ උන්වහන්සේගේ කැමැත්ත හෙළිකිරීම උන්වහන්සේ අපට ලබාදුන්නා වූ තැග්ගයි. ඒ ගැන සතුටුවෙන්න. එය මෙනෙහි කරන්න. ඔබේ මුළු හදවතින්ම එය තබාගන්න. (ගීතාවලිය 119:15-16, 119:69) උන්වහන්සේට විරුද්ධව පව් නොකරන පිණිස උන්වහන්සේගේ වචනය ඔබගේ හදවත තුළ නිධාන කරගන්න. (ගීතාවලිය 119:11)

දෙවියන් වහන්සේව සම්පූර්ණයෙන්ම විශ්වාස කරන්න. **“නුඹේම නුවණෙහි නොපිහිටා නුඹේ වුළු සිතින් ස්වාමීන් වහනසේ කෙරෙහිවිශ්වාස කරපන්න.** ”(හිතෝපදේශ 3:5) ඔබගේ සියළු සැලකිල්ල උන්වහන්සේ කෙරෙහි තබන්න. මක්නිසාද උන්වහන්සේ අප ගැන සැලකිල්ල දක්වන සේක. ( 1 ප්‍රේත්‍රුස් 5:7) **“නුඹේ බර ස්වාමීන් පිට තබව උන්වහන්සේ නුඹ උසුලන සේක. උන්වහන්සේ කිසි කලෙකත් ධර්මිෂ්ඨයා සෙවෙන්ට නොදෙන සේක.”** (ගීතාවලිය 55:22)

මහත් ඇදහිල්ලකින් යුතුව යාච්ඤා කරන්න. මක්නිසාද දෙවියන් වහන්සේ අප ගැන මහත් ලෙස සලකන සේක. **“එබැවින් අපට දයාව ලැබෙන පිණිසද අපේ ඛිනෑකම්වලදී අපට උපකාරයට අනුග්‍රහය සම්බවන පිණිසද නිසැකකමින් කරුණාවේ සිංහාසනයට ළඟා වෙමු.”** (හෙබ්‍රෙව් 4:16)

**“උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම් උප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපගේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කළ උන්වහන්සේ අසන බව අපි දනිමු නම් අප උන්වහන්සේගෙන් ඉල්ලන දේ අපට ලැබෙන බව දනිමුව.”** (1 යොහාන් 5:14-15)

පව් නොකරන්න. යෝසෙප්ගේ ආදර්ශය අනුග මනය කරන්න. "මට වඩා උතුම් කෙනෙක් මේ ගෙයි නැත්තේය. නුඹ ඔහුගේ භාර්යාව බැවින් නුඹ මිස වෙන කිසිවක් මට තහනම් කරලා නැත. එහෙයින් මම මේ මහත් දුෂ්ඨකම කර දෙවියන් වහන්සේට විරුද්ධව කෙසේ පව්කරන්නෙම්දැයි ඈට කීවේය. (උත්පත්ති 39:9) ස්වාමීන් වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් අපිත් ශුද්ධව සිටිමු."
(1 ප්‍රේත්‍රුස් 1:15-16)

උන්වහන්සේට ඔබේ ජීවිතය සම්පූර්ණයෙන්මකැප කරන්න. යෙසායාගේ ආදර්ශය අනුගමනය කරන. **“එවිට මම කවරෙක් යවමිද ... ? අප උදෙසා යන්නේ කවුදැයි කියන්නා වූ ස්වාමීන් වහන්සේගේ හඬ මට ඇසුණේය. මම ද, මෙන්න මම මෙහිය. මා යවනු මැනවයි කීමි.”** (යෙසායා 6:8) යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක. **“මෙන්න, ඔබගේ කැමැත්ත කරන්ට මම ඇවිත් සිටිමියි උන්වහන්සේ කී සේක. උන්වහන්සේ දෙවෙනි එක පිහිටුවන පිණිස පළමුවෙනි එක අහක්කරන සේක.” (හෙබ්‍රෙව් 10:9) පාවුල්තුමා පැවසුවේ....., “එබැවින් සහෝදරයනි නුඹලාගේ ශරීරයන් ජීවමාන වූ, ශුද්ධ වූ දෙවියන් වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන් වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ.”** (රෝම 12:1)

උන්වහන්සේට ස්තුති කරමින් නමස්කාර කරන්න. **“ස්තුති කරමින් උන්වහන්සේගේ දොරටුවලින් ඇතුල්වව, ප්‍රශංසා කරමින් උන්වහන්සේගේ මණ්ඩපවලට පැමිණෙව්, උන්වහන්සේට ස්තුති කරමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා කරව්”** (ගීතාවලිය 100:4) **“මාගේ ආත්මය ස්වාමීන්ට ප්‍රශංසා කරව, මා තුළ ඇති සියල්ල උන්වහන්සේගේ ශුද්ධ වූ නාමයට ප්‍රශංසා කරව්.”** (ගීතාවලිය 103:1)

# නිශ්චලව සිට උන්වහන්සේ දෙවියන් වහන්සේ බව දැනගන්න.

මාගේ ආත්මය ස්වාමීන් වහන්සේ රජකම් කරන බැවින් ප්‍රීතිවෙන්න. උන්වහන්සේට අපගේ මනසේ රැළි සන්සුන් කළ හැකිය. උන්වහන්සේට අභ්‍යන්තර කුණාටුව නිශ්චල කළ හැකිය. එල්ලා වැටෙන හදවතකට ප්‍රබෝධමත් ස්වභාවය වගුරුවා මිහිරි සන්සුන් බවක් සහ සාමයක් රජකම් කිරීමට උන්වහන්සේට හැකිය. ස්වාමීන් වහන්සේව සෑමවිටම විශ්වාස කරන්න. නිශ්චලව සිට උන්වහන්සේ දෙවියන් වහන්සේ බව දැනගන්න. (ගීතාවලිය 46:10) සියලු ලෝක පාලනය කරන්නා වූ ජාතීන්ගේ ඉරණම තිබෙන්නේ කාගේ අතේද .. ? පවුල්වල සහ පුද්ගලයන්ගේ කුඩාම ප්‍රශ්නවලට මඟපෙන්වන්නා වූ තම පියාණන් වහන්සේ සහ මිත්‍රයා දෙවියන් වහන්සේ බව දැන ගැනීම කිතුණුවෙකුගේ හදවතට විශේෂ සැනසීමක් ගෙන දෙන දෙයකි. දෙවියන් වහන්සේ ගැන, උන්වහන්සේගේ බලය, ප්‍රඥාව, ප්‍රේමය, විශ්වාසවන්තකම සහ සත්‍යය ගැන අප වඩ වඩා දැනගන්නා තරමට අපි උන්වහන්සේගේ සිංහාසනය ඉදිරියේ නිහතමානීව නමස්කාරයෙන් හා පුත්‍රයන් ලෙස විශ්වාසයෙන් හා ප්‍රේමයෙන් වැඳ වැටෙන්නෙමු.

ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේව අපේ දෙවියන් වහන්සේ ලෙස දැන ගැනීම යනු අප වටා පවතින කුණාටු සහ ප්‍රචණ්ඩ කැළඹීම් මධ්‍යයේ සැබෑ සාමයේ සියලු මූලාශ්‍ර සහ රහස් හිමිකර ගැනීමයි. මෙම දැනුම අපව ලෝකයේ උද්වේග කර වූ මූලද්‍රව්‍යවලට වඩා ඉහළින් ඔසවා ආත්මයට වඩාත් නිදහසේ හුස්ම ගැනීමටත්, අපගේ බලය වඩාත් සම්පූර්යෙන් පුළුල් කිරීමට හැකි එම පිරිසිදු කලාපයට අපව පත්කරනු ඇත. ඇදහිල්ල දෙවියන් වහන්සේගේ පරිපූර්ණත්වයට ගෞරවය දක්වයි. මෙම පරිපූර්ණත්වය මත අපගේ අපේක්ෂාවන් ඉටු කිරීම බලාපොරොත්තුවයි. ඔවුන් තුළ ප්‍රේමයේ සතුට ඇති වන අතර එය ක්‍රමක්‍රමයෙන් ආත්මයට උරාගන්නේය. සැබෑ දෙවියන් වහන්සේ පොරොන්දු වී ඇති සහ උන්වහන්සේගේ විශ්වාසවන්තකම ඉටුකරනු ලබන අනර්ඝ වූ ආශිර්වාදවල බහුල අස්වැන්න සඳහා ඉවසීමෙන් බලා සිටියි.

මාගේ ආත්මය පැමිණ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමේ ආශිර්වාදය පිළිබඳ වරප්‍රසාදය ඉගෙනගන්න. මාගේ ප්‍රේමවන්ත

**තෝමස් රීඩ් විසිනි. (1776-1841)**

සහෝදරයෙනි, නොරැවටෙල්ලා. සෑම යහපත්දීම ද සෑම සම්පූර්ණ දීමනාවද කිසි වෙනස්වීමක්වත්, හැරීමේ ඡායාවක්වත් නැත්තා වූ ආලෝකවල පියාණන් වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය. (යාකොබ් 1:16-17) උන්වහන්සේගේ පොරොන්දු එසේම ඉටුවන්නේය. උන්වහන්සේගේ සියලු මාර්ග ධර්මිෂ්ඨ සහ සැබෑය. ඔබ ගැන සැලකිල්ල දක්වන තැනැත් වහන්සේ කෙරෙහි සැලකිලිමත් වෙන්න. සෑම උත්සහයකදීම නිශ්චලව සිට උන්වහන්සේ දෙවියන් වහන්සේ බව දැනගන්න.

## ස්වාමීන් වහන්සේ රජකම් කරන සේක.

දෙවියන් වහන්සේගේ අරමුණු ක්‍රමාණුකූලව සහ සෘජුවම ඒවායේ සම්පූර්ණවීම සඳහා ගමන් කරයි. අපගේ අදූරදර්ශී බව උන්වහන්සේගේ බොහෝ කාර්යයන්වලට බාධාවක් වන බව පෙනෙන්නේය. එබැවින්

5 පිටුවට

4 පිටුවෙන්

# නිශ්චලව සිට උන්වහන්සේ...

අපි දාවිත් මෙන් මොර ගැසීමට සූදානම් ද .. ? " දාවිත්ද, මම මහත් අමාරුවකට පැමිණ සිටිමි. ඉතින් ස්වාමීන් වහන්සේගේ අතට භාරවන්නෙමු. මක්නිසාද උන්වහන්සේගේ අනුකම්පාව මහත්ය. මනුෂ්‍යයන්ගේ අතට අසුනොවෙම්වායී ගාද්ට කීවේය." (2 සාමුවෙල් 24:14) නමුත් මෙය බලාපොරොත්තු සුන්වීමේ භාෂාව නොවේද. ? අඳුරු සහ මලානික මාධ්‍යයක් හරහා බලන ආත්මයේ භාෂාව නොවේද .... ? දාවිත් නිවැරදි ආකාරයෙන් ගායනා කළේය. "ස්වාමීන් වහන්සේ රජකම් කරන සේක කියාත්. නොසෙල්වෙන ලෙස ලෝකය පිහිටා තිබේය කියාත්, උන්වහන්සේ මනුෂයය වර්ගයන් සාධාරණකමින් විනිශ්චය කරන සේක කියාත් ජාතීන් අතරේ කියව්." (ගීතාවලිය 96:10) මෙය ඉහළින් මුදාගනු ලැබුවාවූ අයගේ ජයග්‍රහණයේ ගීතිකාවයි. "එවිට මහත් සමූහයකගේ හඬ මෙන්ද, බොහෝ ජනඝෝෂාවක් මෙන්ද, බලවත් ගර්ජනාවලට ශබ්දය මේද හඬක් මට ඇසුණේය. එනම් සර්වපරාක්‍රම වූ අපගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ රජකම් කරන බැවින් හාලෙලූයා." (එළිදරව් 19:6)

එසේ නම් අනපේක්ෂිත කිසිවකට උන්වහන්සේගේ අරමුණුවලට හරස්වීමට හෝ සැලසුම් අවුල් කිරීමට හැකිද ? එසේ කළ නොහැකිය. දෙවියන් වහන්සේගේ සදාකාල අරමුණුවලට ගරුකරන සෑම දෙයක්ම උන්වහන්සේගේ කැමැත්තෙන් පැන නගින අතර අවසානයේ දී සියල්ලම උන්වහන්සේගේ මහිමය උදෙසාය. මීට වඩා උසින් හෝ දුරින් අපට යා නොහැකිය. මම අල්ෆා සහ ඔමේගාය. පළමුවෙනියා සහ අන්තිමයාය. පටන් ගැන්ම සහ කෙළවරය. (එළිදරව් 22:13) වළාකුළු සහ අන්ධකාරය සදාකාලික සිංහාසනය වටකර උන්වහන්සේගේ දීප්තිමත් සැලැස්ම වැසීමට ඉඩ ඇත. නමුත් ඇදහිල්ල කරුණුකොටගෙන වැස්ම බිඳ දමා මෙම අඳුරු දර්ශනයෙන් ඔබ්බට එම්මානුවෙල්ගේ රාජධානියේ නැගී එන තේජස දැකිය හැකි වේ.

## උතුම් වූ ආශීර්වාද

එසේ නම් සැබෑ ආගමේ ආශීර්වාදය කොයිතරම් උතුම්ද ... ? දෙවියන් වහන්සේගේ දරුවන් කොයිතරම් උතුම් වරප්‍රසාදයක් ද .... දිව්‍යමය අවසරයකින් තොරව කිසිවක් සිදු විය නොහැකිය. "තවද දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට සියලුදේම යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමුව." (රෝම 8:28) සාතන් ප්‍රකෝප විය හැකිය. ලෝකය අප්‍රසාදය ඵලකල හැකිය. මාංසය කැරළිගැසිය හැකිය. ඇදහිලිවන්තයාව නිහතමානීව කුරුසියේ ආරක්ෂා කරන සේක. මේ සියලු කුණාටු නොතකා ඇදහිලිවන්තයාගේ ආත්මය ක්‍රිස්තුස් වහන්සේ සමඟ දෙවියන් වහන්සේ තුළ සඟවා තිබේ "නුඹලාගේ ජීවනය ක්‍රිස්තුස් වහන්සේ සමඟ දෙවියන් වහන්සේ තුළ සඟවා තිබේ. " (කොලොස්සි 3:3) "එසේය, මේ කුඩාරමේ සිටින්නා වූ අපි බර උසුලමින් කෙදරිගාමුව, මක්නිසාද පැළඳීම අහක දමන්ට නොව මරණීය වූ එක ජීවනයෙන් ගිලිනු ලබන පිණිස, අපි පළඳිනු ලබන්ට කැමැත්තෙමුව." (2 කොරින්ති 5:4) ඒ අතරම ඔහුට ප්‍රීතිවිය හැකිය. උන්වහන්සේ සදාකාලික තේජසට ඉහළින් එල්ලා ඇති කාලයේ තිරය දෙස බලන සේක. ඉක්මනින් වැස්ම තුලට අතුල්වීමේ ප්‍රීතිමත් අපේක්ෂාවෙන් ඇදහිලිවන්තයා බොහෝ ඉවසිලිවන්තව මෙම කාලයේ පරීක්ෂාවන් විඳදරා ගත යුතුය.

කුඩා දරුවෙකු මෙන් සරලව දේව වචනය පිළිගෙන ඒ අනුව ක්‍රියා කරන මනුෂ්‍යයා සන්තෝෂයෙන් සිටින්නෝය. ඔහු සෑම දෙයකින්ම දෙවියන් වහන්සේව දකින අතර සැගවුණ මන්නා වලින් පෝෂණය ලැබිය හැකිය. දෙවියන් වහන්සේගේ පොරොන්දු සත්‍යතාවයෙන් සහ සැනසීමෙන් පිරී තිබෙන බව ඔහු සොයාගනු ලබයි. තේජාන්විත දවස් ඉක්මනින් පැමිණෙන බැවින් කුණාටු සහිත රාත්‍රියකදී අධෛර්යය නොවිය යුතු බවත් ඔහු දැන සිටියි. "නිශ්චල වව් මා දෙවියන් වහන්සේ බව දැනගනිව්" යන බිය දුරු කිරීම සඳහා කාරුණික වචන වලින් කථා කරන ඔහුගේ සර්වබලධාරී පියාණන් වහන්සේගේ කටහඬ ඔහුට ඇසෙන අතර ඔහු පරිපූර්ණ වූ සමාදානයෙන් සිටින්නෝය.

එබැවින් මාගේ ආත්මය පැමිණ ධෛර්යමත් වෙන්න. ස්වාමීන් වහන්සේ රජකම් කරන සේක. ලෝකය කොයිතරම් නොසන්සුන් වුවත් දාවිත් සමඟ මෙලෙස පවසන්න. "දෙවියන් වහන්සේ අපේ සරණ හා ශක්තියය. දුකේදී ඉතා ළංවූ පිහිටක්ය." (ගීතාවලිය 46:1) ලෝකයේ කරදර ගැන කළනොකිරෙන්න. දෙවියන් වහන්සේට පමණක් බයවෙන්න. උන්වහන්සේගේ පොරොන්දු පමණක් විශ්වාස කරන්න. උන්වහන්සේට පමණක් ප්‍රේම කරමින් සේවය කරන්න. දෙවියන් වහ්නසේගේ මහිමය උදෙසා උන්වහන්සේ කැමති පරිදි නිසැකවම සියල්ල ඔබගේ යහපත උදෙසා එකට සිදුවෙන්නට සලස්වන සේක.

# දෙවියන් වහන්සේ වෙත සමීපවන්නා වූ යාච්ඤාව

**ජේ.සී. රයිලි විසිනි. (1816-1900)**

යාච්ඤා කරන අයට කථා කිරීමට මට ඉඩදෙන්න. මෙම පණිවිඩය කියවන ඇතැම් අය යාච්ඤාව යනු කුමක්දැයි හොඳින් දන්නා බවත්, දේව දරුකමට කැඳවාග ැනීමේ ආත්මය ඇතිව සිටින බවත් මම විශ්වාස කරමි. එවැනි සියලුදෙනාටම මම සහෝදර උපදෙස් සහ අනුශාසනා වචන කිහිපයක් ඉදිරිපත් කරමි. මණ්ඩපයේ පූජා කරන සුවඳ ද්‍රව්‍ය යම් ආකාරයකට සෑදීමට නියම කරන ලදි. සෑම සුවඳ ද්‍රව්‍යක්ම මණ්ඩපයේ දී පූජා කරන්නේ නැත. අපි මෙය මතකයේ තබාගෙන අපගේ යාච්ඤාවේ කාරණය සහ එය කරන ආකාරය ගැන ප්‍රවේශම් වෙමු.

යාච්ඤා කිරීම තුළ නිහතමානිකම සහ ගෞරවාන්විත බවේ වැදගත්කම වෙතට මම ඔබගේ අවධානය යොමු කරමි. අපි කවුද යන්නත් දෙවියන් වහන්සේ සමඟ කථා කිරීම මොනතරම් බැරෑරුම් දෙයක් ද කියාත් කිසිදාක අමතක නොකරමු. නොසැලකිලිමත්කමෙන් සහ සැහැල්ලුවෙන් උන්වහන්සේගේ අභිමුඛත්වයට ඉක්මන් නොවී ප්‍රවේශමෙන් පැමිණෙමු. අපි අපටම මෙසේ කියමු. මම ශුද්ධභූමියේ සිටිමි. මෙය ස්වර්ගයේ දොරටුව මිස අන්කිසිවක් නොවේ. මම පවසන දේ මම අදහස් නොකරමි නම්, මම දෙවියන් වහන්සේ සමඟ වැදගත් වන්නේ නැත. මම මගේ සිතේ අධර්මිෂ්ඨකම ගැන සලකන්නේ නම් ස්වාමීන් වහන්සේ මට ඇහුම්කන් නොදෙන සේක. (නික්මයාම 3:5, උත්පත්ති 28:17), ගීතාවලිය 66:18) සාලමොන්ගේ වචනත් අපි මතකයේ තබා ගනිමු. "නුඹේ මුඛයෙන් ඉක්මන්කාර නොවන්න. නුඹේ සිතද දෙවියන් වහන්සේ ඉදිරියෙහි කාරණයක් නිකුත් කරන්ට ඉක්මන් නොවේවා. මක්නිසාද දෙවියන් වහන්සේ ස්වර්ගයෙහිය. නුඹ පොලොවෙහිය. ඒ නිසා නුඹේ වචන ස්වල්ප වේවා." (දේශනාකාරයා 5:2) " ආබ්‍රහම් දෙවියන් වහන්සේට කථා කළ විට ඔහු මෙසේ පැවසීය. ආබ්‍රහම් උත්තර දෙමින්, බැලුව මැනව, ධූලී හා අලු පමණක් වූ මම ස්වාමීන් වහන්සේට කථාකරන්ට ධෛර්යය ගතිමි. " (උත්පත්ති 18:27) යෝබ් දෙවියන් වහන්සේට කථා කළ විට ඔහු පැවසුවේ "මම නීචයෙක්මි, ඔබට උත්තරයක් දෙන්නේ කෙසේද .. ? මාගේ අතින් කට වසාගනිමි." (යෝබ් 40:4) අපිත් එලෙස කරමු.

ආත්මිකව යාච්ඤා කිරීමේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. (පවරා දෙමි) මම එයින් අදහස් කරන්නේ අපගේ යාච්ඤාවලදී ආත්මයාණන් වහන්සේගේ සෘජු උපකාරය ලබා ගැනීමට අපි නිතරම ප්‍රසව වේදනාව විඳිය යුත බවත්, යාච්ඤාවේ විධිමත්භාවය පිළිබඳ සියල්ලටම වඩා කල්පනාකාරී විය යුතු බවත්ය. එහි ස්වභාවය ආත්මික බවට පත්වීම හැර වෙන කිසිවක් නැත. මෙය පුද්ගලික යාච්ඤාව සම්බන්ධයෙන් විශේෂයෙන්ම සත්‍ය වේ. අපි හැගීම් රහිතව පුරුදු පරිදි මනාව ගැලපුණු පිළිගත හැකි වචන භාවිතා කළ හැකිය. එමෙන්ම ශුද්ධ ලියවිල්ලේ සඳහන් ආකාරයට වැඩි වශයෙන් ඉල්ලීම් කිරීමට කැමති විය හැකිය. ඒ අතරම හැගීමක් නැතිව කටපාඩමින් එය කරනවා සහ පරණ පුරුදු මාර්ගයේම දිනපතා හැම අතටම ගමන් කරනවා විය හැකිය.

මම මේ කාරණය ප්‍රවේශමෙන් සහ සංවේදීතාවයෙන් (සියුම්ව) ස්පර්ශ කිරීමට කැමැත්තේමි. අපට දිනපතා අවශ්‍ය යම් යම් දේවල් ඇති බවත් එම වචන වලින්ම මේ කාරණා සඳහා ක්‍රමානුකූලව අයැද සිටීම අත්‍යාවශ්‍යය දෙයක් නොවන බවත් මම දනිමි. ලෝකය, යක්ෂයා සහ අපගේ හදවත් දිනපතා ඒකාකාරවේ. අවශ්‍ය නම් අපට අපගේ පැරණි මාර්ගයේම ගමන් කළ හැකිය. නමුත් මම මේ කියන දේ සම්බන්ධයෙන් අපි ඉතා කල්පනාකරී විය යුතුය. අපගේ යාච්ඤාවේ සැලැස්ම සහ දළ සටහන පාහේ පුරුදු පරිදි කරන එකක් නම් අපගේ යාච්ඤාව ආත්මයෙන් පූර්ණවීමට හැකිතාක් උත්සාහ කරමු.

යාච්ඤා කිරීම ජීවිතයේ නිත්‍ය කාර්යයක් කර ගැනීමේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. යාච්ඤා කිරීම සඳහා දවසේ සාමාන්‍ය වේලාවන්හි වටිනාකම ගැන මට යමක් පැවසිය හැකිය. දෙවියන් වහන්සේ පිළිවෙලක් (සැලැස්මක්) ඇති දෙවියන් වහන්සේ වන සේක. යුදෙව් දේව මාළිගාවේ උදේ සහ සවස පූජාවන් සඳහා වේලාවන් නියමකර නොතිබුණේ එය තේරුමක් නැති නිසාය. ව්‍යාකූලත්වය පාපයේ ඵලවලින් එකකි. නමුත් මම

6 පිටුවට

5 පිටුවෙන්

# දෙවියන් වහන්සේ වෙත...

කිසිවක් වහල්කම යටතට ගෙන එන්නේ නැත. ඔබගේ ජීවිතයේ සෑම පැය විසිහතරක්ම යාච්ඤා කිරීමේ කාර්යයේ කොටසක් කර ගැනීම ඔබගේ ආත්මයේ සෞඛ්‍යයට අත්‍යාවශ්‍ය බව පමණක් මම කියන්නෙමි. ඔබ කෑමට, නිදා ගැනීමට සහ ඔබගේ අනෙකුත් කාර්යයන් වලට කාලය වෙන්කර ගන්නවාසේම යාච්ඤා කිරීමට ද කාලය වෙන්කරන්න. ඔබගේම පැය සහ අවස්ථාවන් ගණන තෝරගන්න. අවම වශයෙන් ඔබ ලෝකය සමඟ කථා කිරීමට පෙර උදෑසන දෙවියන් වහන්සේ සමඟ කථාකරන්න. ඔබ ලෝකය සමඟ කටයුතු කළ පසු රාත්‍රියේ නින්දට යාමට පෙර දෙවියන් වහන්සේ සමඟ කථා කරන්න. නමුත් යාච්ඥා කිරීම සෑම දිනකම උතුම් දේවලින් එකක් බව ඔබගේ මනසේ ස්ථිරව තබාගන්න. එය පැත්තට තල්ලු නොකරන්න. යාච්ඤාව ඔබගේ කාර්යයන් වලින් ඉවතලන සහ අවශ්‍ය දෙයක් නොවන බවට පත්වීමට ඉඩ නොදෙන්න. ඔබ වෙනත් කුමන කාර්යය කළත්, යාච්ඤාවේ කාර්යය ඉටුකරන්න.

යාච්ඤා කිරීම තුළ නොපසුබට උත්සාහය වැදගත් බව මම ඔබට ප්‍රකාශ කරමි. යාච්ඤා කිරීමට පෙළඹීමේ පුරුද්ද ආරම්භ කලායින් පසුව කිසිවිටෙකත් එය නැවත අත්නොහරින්න. මම පවුලේ යාච්ඤාව කර තිබේ. මම පුද්ගලික යාච්ඤාව අත්හැරියොත් ඇති විය හැකි හානිය කුමක්දැයි සමහර විට ඔබගේ හදවත පවසනු ඇත. මට සනීප නැහැ. මට නිදිමතයි හෝ මම වෙහෙසට පත්ව සිටිමි. මම පුද්ගලිකව යාච්ඤා කිරීම අවශ්‍ය නැහැ කියා ඔබේ ශරීරය සමහර විට පවසනු ඇත. මට අද දිනයේ සහභාගිවීමට වැදගත් කාර්යයක් තිබේ. මගේ යාච්ඤාව කෙටි කළ යුතු යැයි ඔබගේ මනස සමහර විට පැවසිය හැකිය. සාතන්ගෙන් කෙලින්ම පැමිණෙන එවැනි යෝජනා දෙස බලන්න. ඒවා සියල්ලම නොසලකා හරින්න යැයි ඔබගේ ආත්මය තුළ ප්‍රකාශ කිරීම යහපත්ය.

යාච්ඤාව සෑම විටම එක ලෙසම දීර්ඝ විය යුතු යැයි මම පවසන්නේ නැත. නමුත් මම කියන්නේ නිදහසට කිසිම හේතුවක් තබාගෙන යාච්ඤා කිරීම අත්නොහරින්න කියාය. පාවුල්තුමා පැවසුවේ..., " ***යාච්ඤාවේ නොකඩවා පවතින්න." සහ "නොකඩවා යාච්ඤා කරන්න"*** කියාය. (කොලොස්සි 4:2, 1 තෙසලෝනික 5:17) ඔහු අදහස් කළේ මනුෂ්‍යයන් සෑමවිටම දණින් සිටිය යුතු බව නොව අපගේ යාච්ඤාව නොකඩවා දැල්වෙන්නා වූ පූජාවක් මෙන් දවස්පතා ස්ථිරව ආරක්ෂා කරගත යුතු එකක් බවයි. එය බීජ කාලයේ සිට අස්වැන්න නෙලීමේ කාලය දක්වාද, ගිම්හාන කාලයේ සිට ශීත කාලය දක්වාද නියමිත කාලවලදී නොනැවතී පැමිණෙන ලෙසද විය යුතුය. එය සෑම විටම පුද පූජා දවා නොගෙන සම්පූර්ණයෙන්ම නිවී නොයන පූජාසනය මත තිබෙන ගින්නක් මෙන් විය යුතුය. නොබිඳුණු දම්වැලක් මෙන් උදේ සහ සවස මෙනෙහි කිරීම් වලින් දවසේ කෙටි යාච්ඤාවක් හරහා සියල්ල එකට බැඳිය හැකි බව අමතක නොකරන්න. සමාග මේදී හෝ ව්‍යාපාරවලදී හෝ වීදියේදී පවා ඔබ අර්තක්ෂස්තා ඉදිරියේ නෙහෙමියා කළාක් මෙන් නිහඬව දෙවියන් වහන්සේ වෙත කුඩා පණිවිඩයක් යවනවා විය හැකිය. (නෙහෙමියා 2:4)

යාච්ඤාවේ උද්යෝගිමත්ව සිටීමේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. පුද්ගලයෙකු උද්යෝග යෙන් සිටින බව ඔප්පු කිරීම සඳහා කෑගැසීම හෝ තදින් මොරගැසීම හෝ ඉතා උස් හඬින් කතා කිරීමට අවශ්‍යය නොවේ. නමුත් අපි හදවතින්ම උද්යෝගිමත්ව සහ උණුසුම් විය යුතු අතර අප කරන්නේ කුමක්ද ..? යන්න ගැන සැබවින්ම උනන්දුවෙන් විමසිය යුතුය. එය බොහෝ ප්‍රයෝජන ලබන දැඩි ඵලදායී යාච්ඤාවකි. ***"එබැවින් නුඹලාගේ වහදෑ එකිනෙකාට කියාදී, සුව ලබන පිණිස එකිනෙකා උදෙසා යාච්ඤා කරපල්ලා, ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පු කරන කන්නලව්ව කරුණාකොටගෙන මහත් දේ ඉෂ්ඨ වෙයි."*** (යාකොබ් 5:16) යාච්ඤාව ගැන ශුද්ධ ලියවිල්ලේ භාවිතා කර ඇති ප්‍රකාශයන් මගින් අපට උගන්වන පාඩම මෙයයි. එය හැදින්වෙන්නේ හැඩීම, තට්ටුකිරීම, පොර බැඳීම, සටන්වැදීම, ප්‍රසව වේදනාව යනුවෙනි. ශුද්ධ ලියවිල්ලේ උදාහරණ මගින් අපට උගන්වන පාඩම මෙයයි. යාකොබ් එවැනි කෙනෙකි. ඔහු පෙනියෙල්හිදී දේවදූතයාට මෙසේ පැවසුවේය. ***"... ඔහු ද ඔබ වට ආශීර්වාද කළොත් මිස නැත්නම් යන්ට නොහරිමියි කීය."*** (උත්පත්ති 32:26) දානියෙල් තවත් කෙනෙකි. ඔහු දෙවියන් වහන්සේට කන්නලව් කළ ආකාරය බලන්න. ***"ස්වාමීන් වහන්ස .., ඇසුව මැනව, ස්වාමීන් වහන්ස..., කමාවුව මැනව. ස්වාමීන් වහන්ස .., ඇහුම්කන් දුන මැනව, මාගේ දෙවියන් වහන්ස..., ප්‍රමාද නොවී ඔබ නිසාම එය ඉෂ්ඨ කළ මැනව, එක්නිසාද ඔබගේ නුවරත්, ඔබගේ සෙනඟත්, ඔබගේ නාමය දරන්නෝ යයි කීවෙමි."*** (දානියෙල් 9:19) අපගේ ස්වාමීන් වන යේසුස්වහන්සේ තවත් කෙනෙකි. උන්වහන්සේ ගැන ලියා ඇත්තේ මෙසේය. ***"උන්වහන්සේ මාංශවත්ව සිටි දවස්වලදී තමන් වහන්සේ මරණයෙන් ගලවන්ට පුළුවන් වූ තැනැත්තාහට බලවත් හැඬීමෙන් හා කඳුළින් යුක්ත යාච්ඤා සහ කන්නලව් ඔප්පු කර තමන්ගේ දේව භය නිසා උත්තර ලැබ උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නමුත් තමන් විඳ දේවලින් කීකරුකම ඉගෙන ගත් සේක."*** (හෙබ්‍රෙව් 5:7-8)

මෙය අපගේ බොහෝ කන්නලව් වලට වඩා කොපමණ වෙනස්ද ... ? ඔවුන් සමඟ සැසඳීමේදී අපගේ ඇල්මැරුණු නිවට ස්වභාවය පෙනෙන්නේය. ඔබ යාච්ඤා කර ඉල්ලන දේ සැබෑවටම ඔබට අවශ්‍ය නැහැ කියා අප අතරෙන් බොහෝ දෙනෙකුට කොයිතරම් සත්‍යවශයෙන් දෙවියන් වහන්සේට පැවසිය හැකිද .. ? අපි මෙම දෝෂය නිවැරදි කිරීමට උත්සාහ කරමු. කරුණාවේ දොරටුවට තදින් තට්ටු කරමු. දයාවේ වන්දනාකරුවන්වීම වර්ධනය කර ගනිමු. ඇහුම්කන් නුදුන්නොත් විනාශ වන්නන් මෙන්ද, ශීතලව යාච්ඤා කිරීම ගින්දර නැතිව පූජාව ඔප්පු කරන්නාක් මෙන්ද පවතින බව අපගේ සිත් තුළ නිරාකරණය කර ගනිමු.

ඇදහිල්ලේ යාච්ඤා කිරීමේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. දෙවියන් වහන්සේ අපගේ යාච්ඤාවලට ඇහුම්කන් දෙන බව විශ්වාස කිරීමට දැඩි ලෙස උත්සාහ කළ යුතුය. දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව අපි දේවල් ඉල්ලා සිටියොත් අපට පිළිතුරු ලැබෙනු ඇත. අපගේ ස්වාමීන් වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සරල ආඥාව මෙයයි. ***"එබැවින් නුඹලාට කියමි. නුඹලා යාච්ඤාකොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුණේ යයි අදහාපල්ලා. ඒවා නුඹලාට ලැබෙන්නේය."*** (මාර්ක් 11:24) ඇදහිල්ල නොමැතිව යාච්ඤාව නැමති ඊතලය නියමිත ඉලක්කයට වදින්නේ නැත. අපගේ යාච්ඤාවලදී පොරොන්දු අයැද සිටීමේ පුරුද්ද අපි වර්ධනය කරගත යුතුය. අපි සමහර පොරොන්දු අප සමඟ ගත යුතුය. තවද, ස්වාමීනී..., මෙන්න ඔබගේම වචනය පොරොන්දුවී ඇත. ඔබවහන්සේ කී ලෙස අපට කළ මැනව කියා කියන්න. යාකොබ්, මොසෙස් සහ දාවිත් වැනි අයගේ පුරුද්ද මෙයයි. ගීතාවලිය 119 වන ගීතිකාවේ "ඔබගේ වචනයට අනුව" කියා ඉල්ලන දේවලින් පිරී ඇත. සියල්ලට වඩා අපගේ යාච්ඤා වලට පිළිතුරු අපේක්ෂා කිරීමේ පුරුද්ද අපි වර්ධනය කරගත යුතුයි. තම නැව් මුහුදට යවන වෙළඳුන් මෙන් යම් කිසි ප්‍රතිලාභයක් දුටුවොත් මිස අපි සෑහීමකට පත් නොවිය යුතුය. රොබට් ට්‍රෙල්ගේ ගාම්භීර කියමනකින් කිතුණුවන්ට කරුණු කිහිපයක් තිබේ. මනුෂ්‍යයන් සැලකිලිමත් නොවන විට යාච්ඤාව තුළ සුළු දෙයක් නැති බව සහතික කර ගැනීමට ලකුණක් නැත.

යාච්ඤාවේදී නිර්හීතකමේ වැදගත්කම මම ඔබ ප්‍රකාශ කරමි. සමහර අයගේ යාච්ඤාවල මට වර්ණනා කරන්න බැරි තරම් සමීප බවක් (හුරුපුරුදුකමක්) තියෙනවා. නමුත් ශුද්ධ වූ නිර්හීතකමක් එහි ඇත. එය අතිශයින්ම අපේක්ෂා කළ යුතුය. මම අදහස් කරන්නේ ඊශ්‍රායෙල් සෙනඟව විනාශ නොකරන ලෙස මෝසෙස් දෙවියන් වහන්සේට කන්නලව් කරන විට තිබුණා වූ නිර්හීතකමයි. ***"මෝසෙස් තමන් දෙවි වූ ස්වාමීන් වහන්සේට කන්නලව් කරනුයේ, ස්වාමීන් වහන්ස.., ඔබ මහත් බලයෙන් හා බලසම්පන්න හස්තයකින් මිසර දේශයෙන් ගෙනාවා වූ ඔබගේ සෙනඟට විරුද්ධව ඔබගේ උදහස අවිලෙන්නේ මන්ද ... ? උන්වහන්සේ ඔවුන් පිටතට ගෙනගියේ නපුර පිණිසය. එනම් කඳුවලදී ඔවුන් මරා පොළෝ තලය මතු පිටින් ඔවුන් නැති කරන පිණිස යයි කියන්ට මිසරවරුන්ට ඉඩ දෙන්නේ එක්නිසාද ..? ඔබගේ තද උදහසින් හැරී ඔබගේ සෙනඟට පවුණුවන්ට යන මේ විපත ගැන නැවුණ මැනව."*** (නික්මයාම 32:11-12) මම අදහස් කරන්නේ ඊශ්‍රායෙල් සෙනඟ හායි නරගයේ මනුෂ්‍යයන් ඉදිරියේ දී පරාජය වූ විට යොෂුවාගේ යාච්ඤාවේ තිබූ නිර්හීතභාවයයි. ***"අහෝ ..., ස්වාමීන් වහන්ස..., ඊශ්‍රායෙල්වරු තමුන්ගේ සතුරන්ට පිටුපෑවාට පසු වම වක්කියව් ද .. ? කානානිවරුන් ද , දේශයේ සියලු වැසියන් ද, ඒ අසා අප වටලා අපේ නාමය පොළොවෙන් සිඳ දමනවා ඇත. එවිට ඔබගේ මහත් නාමය ගැන ඔබ කරන්නේ කුමක්දැයි කීය."*** (යොෂුවා 7:8-9)

මාටින් ලූතර්ගේ කැපී පෙනෙන නිර්හීතකම මෙයයි. ඔහු යාච්ඤා කරනවා අසා සිටි කෙනෙක් පැවසුවේ .., මොනවගේ ආත්මයක් ද, ඔහුගේ ප්‍රකාශය තුළ කොපමණ විශ්වාසයක් තිබෙනවාද .. ? ඔහු ඉතා ගෞරවයෙන් ආයාචනා කළේ දෙවියන් වහන්සේගෙන් සිගමන් අයැදින්නාක් මෙන්ය. නමුත් ආදරණීය පියෙකු සමඟ පුත්‍රයෙක් කතා කරනවාක් මෙන් ස්ථිර බලාපොරොත්තුවක් සහ සහතිකයක් ඇතිවය. දාහත්වන සියවසේ ස්කොට්ලන්තයේ ශ්‍රේෂ්ඨ ලෙස දිව්‍යමය ස්වභාවය ඇතිව සිටි බෘස්ගේ කැපී පෙනුණු නිර්හීතකම මෙයයි. ඔහුගේ යාච්ඤාව ස්වර්ගයට වෙඩි තබන මූනිස්සම් වගේ යැයි කියනු ලැබේ. මෙහිදීත් අපි කණගාටුදායක ලෙස දුර්වලව සිටී යැයි මා තුළ බියක් ඇත. ඇදහිලිවන්තයාගේ වරප්‍රසාද අපි ප්‍රමාණවත් ලෙස අවබෝධ කරගෙන නැත. ස්වාමීනී..., අපි ඔබගේම සෙනඟ නොවේද.. ? අපව විශුද්ධ කරනු ලැබිය යුත්තේ ඔබගේ මහිමය උදෙසා නොවේද ... ? ඔබගේ සුභාරංචිය පැතිරී වර්ධනය විය යුත්තේ ඔබගේ ගෞරවය උදෙසා නොවේද .. ? කියා නිතර අපි ආයාචනා කරන්නේ නැත.

යාච්ඥාවේ පූර්ණත්වයේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. මවා පෑමක් සඳහා දීර්ඝ ලෙස යාච්ඥා කළ එරිසිවරුන්ගේ ආදර්ශයට එරෙහිව අපගේ

7 පිටුවට

6 පිටුවෙන්

# දෙවියන් වහන්සේ වෙත...

ස්වාමීන් වහන්සේ අනතුරු අඟවන බව මට අමතක නැත. අපි යාච්ඤා කරන විට නිශ්ඵල වචන (නිරර්ථක වචන) භාවිතා නොකරන ලෙස අපට අණකර තිබෙන සේක. නමුත් අනිත් අතට දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් මුළු රාත්‍රිය පුරාම විශාල හා දීර්ඝ ලෙස භක්තිවන්තකමෙන් ස්වාමී වූ යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ අනුමැතිය ලබාගත් බව මට අමතක කළ නොහැකිය. සියලු කාරණාවලදී මේ දවස්වල ඕනෑවටත් වැඩිය යාච්ඤා කරනවා යැයි කීමට ඉඩක් නැත. මේ පරම්පරාවේ බොහෝ ඇදහිලිවන්තයන් අඩුවෙන් යාච්ඤා කිරීම ගැන බිය විය යුතු නොවේද ? බොහෝ කිතුණුවන් යාච්ඤාවට දෙන සැබෑ කාලය ඉතා කුඩා නොවේද .. ? මෙම ප්‍රශ්නවලට සතුටුදායක ලෙස පිළිතුරුදීමට නොහැකිවීම ගැන මම බිය වෙමි. බොහෝ දෙනාගේ පුද්ගලික භක්තිවන්තකම වේදනාකාරී ලෙස අල්ප සහ සීමිත යැයි මම බයවෙමි. එය ඔවුන් තුළ ජීවනය නැති බව ඔප්පු කිරීමට ප්‍රමාණවත්ය. ඔවුන්ට දෙවියන් වහන්සේව අවශ්‍ය වන්නේ අල්ප වශයෙන් බව පෙනෙන්නට ඇත. ඔවුන්ගේ පසුතැවිලිවීමත්, අයැදීමත්, උන්වහන්සේට ස්තුති කිරීමත් අල්පව තිබෙන බව පෙනෙන්නේය.

මෙය සම්පූර්ණ වැරදිය. ඇදහිලිවන්තයන් තමන් ජයග්‍රහණය නොලබන බවට මැසිවිලි නගනවාට වඩා පොදු දෙයක් නැත. ඒ තුලින් ඔවුන් අපට පවසන්නේ ඔවුන් රිසි සේ කරුණාවෙන් වර්ධනය නොවන බවයි. බොහෝ දෙනෙකුට ඔවුන් ඉල්ලන තරමට වඩා කරුණාව ඇති බව අවබෝධ කර ගැනීම වඩා හොඳ නොවේද ..... ? බොහෝ දෙනෙකුගේ සත්‍යය වාර්තාව වන්නේ ඔවුන් ඉල්ලන්නේ ස්වල්පයකි. ඔවුන්ගේ දුර්වලකමට හේතුව ඔවුන්ගේම මුවහත් නැති (මොට්ට) කුරු (අස්වභාවිකව ඉතා කුඩා) ආධිපත්‍යය නැති නමුත් වේගවත් සහ පැහැදිලි කථා විලාසයකින් යුතු, හැකිලී තිබෙන්නා වූ, කඩිමුඩියේ කෙරෙන පටු (සීමිත) සහ පිරිහී තිබෙන යාච්ඤාවලින් සොයාගත හැකිය. ඔවුන් ඉල්ලන්නේ නැති නිසා ඔවුන්ට ලැබෙන්නේ නැත. අපි ක්‍රිස්තුස් වහන්සේ තුළ නොව අප තුළම සීමාවී සිටින්නෙමු. ස්වාමීන් වහන්සේ පවසන්නේ ...., **"විසර දේශයෙන් තා පිටතට ගෙනාවා වූ තාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ වවය. තාගේ කට හොඳටම ඇරුව, වම ද එය පුරවන්නෙවි. "** (ගීතාවලිය 81:10) කියා වන සේක. නමුත් අපි ඊශ්‍රායෙල් හි රජු මෙන් පස්වතාවක් හෝ හය වතාවක් පහරදිය යුතු විට තුන් වතාවක් බිමට පහර දී නැවතී සිටින්නෙමු. (2 රාජාවලිය 13:14-19)

යාච්ඤාවේ විශේෂත්වයේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. අපි සාමාන්‍යය ඉල්ලීම් වලින් සෑහීමකට පත් නොවිය යුතුය. කරුණාවේ සිංහාසනය ඉදිරියේ අපගේ අවශ්‍යතා සඳහන් කළ යුතුය. තමන් පව්කාරයෙක් බව පාපොච්චාරණය කිරීම ගැන සෑහීමකට පත් නොවිය යුතුය. අප වඩාත්ම වැරදිකාරයන් බව අපගේ හෘදය සාක්ෂිය අපට පවසන පාපයන් නම් කළ යුතුය. ශුද්ධකම ඉල්ලා සිටීම ගැන සෑහීමකට පත් නොවිය යුතුය. අපට කරුණාව වඩා අඩු යැයි හැගෙන කාරණා නම් කළ යුතුය. අපි කරදරයක සිටින බව ස්වාමීන් වහන්සේට පැවසීම පමණක් ප්‍රමාණවත් නොවිය යුතුය. අපි අපේ කරදර සහ එහි සියළු සුවිශේෂතාවයන් විස්තර කළ යුතුය. යාකොබ් තම සහෝදරවූ ඒසව්ට බය වූ විට දී කළේ මෙයයි. ඔහු තමා බියවන දේ දෙවියන් වහන්සේට හරියටම කියයි. (උත්පත්ති 32:11) එලෙයාසර් තම ස්වාමියාගේ පුත්‍රයාට භාර්යාවක් සෙවීමේදී කළේ මෙයයි. ඔහු දෙවියන් වහන්සේ ඉදිරියේ ඔහුට අවශ්‍ය දේ නිවැරදිව කීවේය. (උත්පත්ති 24:12) මාංසයේ කටුවක් තිබූ විට පාවුල් කළේ මෙයයි. ඔහු ස්වාමීන් වහන්සේට කන්නලව් කළේය. (2 කොරින්ති 12:8) මෙය සැබෑ ඇදහිල්ල සහ විශ්වාසයයි. දෙවියන් වහන්සේ ඉදිරියේ පැවසීමට නොවටිනා තරම් එය කුඩා දෙයක් යැයි නම් කිරීමට කිසිවක් නොමැති බව අපි විශ්වාස කළ යුතුය. මා අසනීපයෙන් සිටින බව වෛද්‍යවරයාට පැවසුවත් අසනීපය පැහැදිලිව නොකියන රෝගියා ගැන අප සිතිය යුත්තේ කුමක්ද ... ? තම ස්වාමිපුරුෂයාට තමා සතුටින් නොවන බව පැවසුවත් ඊට හේතුව සඳහන් නොකළ බිරිඳ ගැන අප සිතිය යුත්තේ කුමක්ද .. ? ක්‍රිස්තුස් වහන්සේ ආත්මයේ සැබෑ මනමාලයා සහ හදවතේ සැබෑ වෛද්‍යවරයාය. උන්වහන්සේ සියලු ජනයාගේ සැබෑ පියාය. උන්වහන්සේ සමඟ අපගේ සන්නිවේදනය අපට දැනෙන බව අපගේ නොසැලී සිටීමෙන් පෙන්වමු. අපි උන්වහන්සේගෙන් කිසිවක් සඟවා නොගෙන මුළු හදවතින්ම උන්වහන්සේට කියමු.

අපගේ යාච්ඤා කිරීම තුළ මැදහත්කාරකමේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. අප සියල්ලන්ම ස්වභාවිකම ආත්මාර්ථකාමී වන අතර අපගේ ආත්මාර්ථකාමීත්වය අප ගැලවීම ලබන විට වුවත් අපට ඇලී තිබීමට පුළුවන. අපේ ආත්මය, අපගේම ආත්මික ගැටුම්, අපගේ ආත්මික දියුණුව ගැන පමණක් සිතන අන් අයව අමතක කිරීමේ ප්‍රවණතාවයක් අප තුළ තිබේ. මෙම ප්‍රවණතාවයට එරෙහිව අපට අවශ්‍ය වන්නේ අවම වශයෙන් යාච්ඤා කිරීම නොව සෝදිසියෙන් සිටීමින් පොර බැඳීමයි. කරුණාවේ සිංහාසනය ඉදිරියේ අපගේ නමට අමතරව වෙනත් අයගේ නම් ප්‍රකාශ කරමින් මැදහත්කාරකම් කිරීමට අපි අපවම පොළඹවා ගත යුතුය. මුලු ලෝකයම ගැන නැති වුවත් සැබෑ ඇදිහිලිවන්තයන්ගෙන් සැදුම්ලත් ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය වන සභාව, අප ජීවත්වන රට, අපගේ නෑදෑයන් සහ මිතුරන් අපගේ හදවත්වල දරා ගැනීමට උත්සාහ කළ යුතුය. මේ සෑම දෙනා උදෙසා අපි මැදහත්කාරකම් කළ යුතුය.

මෙය උසස්ම කැපවීමේ ක්‍රියාවයි. ඔවුන්ගේ යාච්ඤාවලදී මට ආදරය කරන ඔවුන් මට හොඳම ලෙස ආදරය දක්වයි. මෙය අපගේ ආත්මයට සුවය සලසාදෙනු ලබයි. අපගේ අනුකම්පාව විශාල කර අපගේ හදවත් පුළුල් කරනු ලබයි. මෙය සභාවට යහපත සලසාදෙනු ලබයි. සුභාරංචිය පතල කිරීමේ යන්ත්‍රයේ සියලුම දැති රෝද කැරකෙන්නේ යාච්ඤාවෙනි. කන්ද උඩදී මෝසෙස් මෙන් මැදහත්කාරකම් කරන අයත් යොෂුවා මෙන් සටන් භූමියේ සටන් කරන අයත් ස්වාමීන් වහන්සේගේ අරමුණ උදෙසා බොහෝ දේ කරති. මෙය ක්‍රිස්තුස් වහන්සේ මෙන් විය යුතුය. උන්වහන්සේ තම සෙනගගේ උත්තම පූජකයාණන් ලෙස පියාණන් වහන්සේ ඉදිරියේ ඔවුන්ගේ නම් දරා සිටින සේක. මෙය යේසුස් වහන්සේ මෙන්වීමේ වරප්‍රසාදයේ ස්වභාවයයි. දේව සේවකයෙකුට සැබෑ උපකාරයෙකුවීමට මෙයින් හැකියාව ලැබේ. මම සභාවක් තෝරා ගත යුතු නම්, යාච්ඤා කරන සෙනගක් සිටින සභාවක් මට දෙන්න කියා ඉල්ලමි.

යාච්ඤා කිරීමේ දී ස්තුතිවන්තවීමේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. දෙවියන් වහන්සේගෙන් ඉල්ලීම එක් දෙයක් බවත්, උන්වහන්සේට ප්‍රශංසා කිරීම තවත් දෙයක් බවත් මම හොඳින් දනිමි. නමුත් බයිබලයේ යාච්ඤාව සහ ප්‍රශංසාව අතර සමීප සම්බන්ධතාවය කොයිතරම්දැයි දකිමි. ස්තුතිවන්තවීමේ කොටසක් නැති යාච්ඤාව සැබෑ යාච්ඤාවක් ලෙස හැදින්වීමට මම එඩිතර නොවෙමි. පාවුල්තුමා මෙලෙස පවසන්නේ නිකම්ම නොවේ. " නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා සියල්ලෙහිදී ස්තුතිදීම සමඟ යාච්ඤාවෙන්ද, කන්නලව්වෙන්ද, නුඹලාගේ ඉල්ලීම් දෙවියන් වහන්සේට දන්වාපල්ලා. (පිලිප්පි 4:6) ස්තුතිදීමෙන් යුක්තව යාච්ඤාවෙහි අවදිව සිට, නොකඩවා එහි පැවතියල්ලා. (කොලොස්සි 4:2) මෙය අපි අපායේ නොසිටීමේ කරුණාවයි. අපට ස්වර්ගයේ බලාපොරොත්තුව තිබීමේ දයාවයි. ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන අපව කැඳවනු ලැබීමත් අපගේම මාර්ගවල ඵල නෙලා ගැනීමට ඉතිරි නොවීමේ දයාවෙනුත් යුක්තය. අපි තවමත් ජීවත්වන අතර දෙවියන් වහන්සේව ක්‍රියාශීලීව හෝ නිශ්ක්‍රීයව මහිමයට පත්කිරීමට අවස්ථාව ලබාදීමේ දයාවයි. අපි දෙවියන් වහන්සේ සමඟ කථාකරන සෑම අවස්ථාවකදීම මෙම සිතුවිලි අපගේ මනසේ පැවතිය යුතුය. අප ජීවත්වෙන එම නිදහස් කරුණාව වෙනුවෙන් සහ සදාකාලිකව පවතින එම ප්‍රේමණීය කරුණාව වෙනුවෙන් ස්තුතිවන්ත නොවී යාච්ඤාවෙන් අපගේ තොල් විවෘත නොකළ යුතුය. ස්තුතිවන්තකමෙන් පූර්ණ නැති විශිෂ්ඨ ශුද්ධවන්තයෙක් කිසිදාක සිටියේ නැත. පාවුල්තුමා කිසිවිටෙකත් ස්තුතිවන්ත පූර්වක නොවී ලිපියක් ලියන්නේ නැති තරම්ය. ප්‍රිය මිත්‍රවරුණි.., අපි අපේ දවස්වල දීප්තියෙන් හා බැබළෙන ආලෝකයන් වන්නේ නම්, අපි ප්‍රශංසාවෙන් යුක්ත වූ ආත්මයක් අගේ කළ යුතුය. අපගේ යාච්ඤාවෙන් ස්තුතිවන්ත යාච්ඤාවන් වේවා ...

ඔබගේ යාච්ඤාව කෙරෙහි සෝදිසියෙන් සිටීමේ වැදගත්කම මම ඔබට ප්‍රකාශ කරමි. යාච්ඤාව යනු සියල්ලට වඩා ඔබ සෝදිසියෙන් සිටිය යුතු ආගමික ලක්ෂණය වේ. සැබෑ ආගමිකත්වය ආරම්භ වන්නේ ඒ තුලිනි. මෙය සශ්‍රීකත්වය විදහා පෑමයි. පුද්ගලයෙකුගේ යාච්ඤාව කුමක්දැයි මට කියන්න. එවිට ඔහුගේ ආත්මයේ තත්ත්වය මම ඉක්මනින් ඔබට කියන්නෙමි. යාච්ඤාව ආත්මික ස්පන්දනයයි. මෙමගින් අධ්‍යාත්මික සෞඛ්‍යය පරීක්ෂා කළ හැකිය. යාච්ඤාව යනු අධ්‍යාත්මික ජීවිතයේ බැරෝමීටරයයි. (කාලගුණය මනින ඒකකයයි.) යාච්ඤාව කරුණුකොටගෙන අපගේ හදවතේ කාලගුණය හරිද වැරදිද කියා අපට අවබෝධවන්නේය.

අපි අපගේ පුද්ගලික භක්තිය දෙස නොකඩවා බලා සිටිමු. අපගේ ප්‍රායෝගික ක්‍රිස්තියානි ධර්මයේ හදවත මෙයයි. දේශන, පොත්පත්, පත්‍රිකා, කම්ටු රැස්වීම් සහ යහපත් මිනිසුන්ගේ ඇසුර යන සියල්ලෙන් ඔවුන්ගේ ක්‍රියාවන් යහපත්ය. නමුත් ඒවා කිසිවිටෙකත් පුද්ගලික යාච්ඤාව නොසලකා හැරීම සඳහා වන්දිය ගෙවන්නේ නැත. දෙවියන් වහන්සේ සමඟ ඇති සහයෝගීතාවයෙන් ඔබගේ හදවත ඉවත් කරනු ලබන ස්ථාන, සමාජය, සහකරුවන් හොඳින් සලකුණු කර ඔබගේ යාච්ඤාවන් දැඩි ලෙස මෙහෙයවන්න. එය ඔබගේ ආරක්ෂාවට ප්‍රයෝජනවත්වේ. ඔබගේ ආත්මය වඩාත් ආත්මික රාමුව තුළ තමන්ගේ කුමන මිතුරන් හා කුමන රැකියාවද යන්න නිශ්චිතවම නිරීක්ෂණය කරන්න. දෙවියන් වහන්සේ සමඟ කථා කිරීමට වඩාත් සූදානමින් මෙයට තදින් ඇලී සිටින්න. ඔබ ඔබගේ යාච්ඤාව ගැන බලා සිටින්නේ නම්, ඔබගේ ආත්මයට කිසිදාක වරදක් සිදු නොවනු ඇත.

ඔබගේ සලකා බැලීම උදෙසා මම මෙම කරුණු ඉදිරිපත් කරමි. මම එය නිහතමානීව ඉදිරිපත් කරමි. නමුත් දෙවියන් වහන්සේ සත්‍යය බව මම විශ්වාස කරන අතර මම සහ මා කැමති සියල්ලට වඩා යාච්ඤාවේ කාරණා දැකීමට මම කැමැත්තෙමි.

Reg. No: Dop/News/33/2025
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.



# ඒ දවස උදෙසා මාගේ හදවත සූදානම් කර ගැනීම

(ජෝර්ජ් මුලර් විසිනි.) (1805-1898)

අවුරුදු 14 කට වැඩි කාලයක් මට අහිමි නොවූ සත්‍යතාවයක් මට ඉගැන්වීමට ස්වාමීන් වහන්සේ සතුටු වූ සේක. ඒ කාරණය නම්, සෑම දිනකම මම සහභාගිවිය යුතු පළමු ශ්‍රේෂ්ඨ හා ප්‍රධාන කාර්යය වූ ස්වාමීන් වහන්සේ තුළ මාගේ ආත්මය සතුටු කිරීම බව මම වෙන කවදාටත් වඩා පැහැදිලිව දුටුවෙමි. සැලකිලිමත් විය යුතු පළමු දෙය නම් මම කොපමණ ස්වාමීන් වහන්සේට සේවය කරනවාද යන්න නොව මාගේ ආත්මය ස්වාමීන් වහන්සේ තුළ ප්‍රීතිමත් තත්ත්වයකට පත්කරන්නේ කෙසේද යන්න සහ මාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා පෝෂණය වන්නේ කෙසේද යන්නයි.

ගැලවීම නොලැබුවා වූ අය ඉදිරියේ සත්‍යතාවය ප්‍රකාශ කිරීම කරුණුකොටගෙන ස්වාමීන් වහන්සේට සේවය කිරීමට මම උත්සාහ කළ හැකිය. මම ඇදහිලිවන්තයන්ට ප්‍රයෝජනවත් ලෙස ජීවත්වීමට උත්සාහ කළ හැකිය. මම දුක්විඳීම් දරා ගැනීමට පංගුකාර විය හැකිය. මම වෙනත් ආකාර වලින් මේ ලෝකයේදී දෙවියන් වහන්සේගේ දරුවෙකු ලෙස හැසිරීමට උත්සාහ කළ හැකිය. නමුත් ස්වාමීන් වහන්සේ තුළ සතුටු නොවී දිනෙන් දින මාගේ අභ්‍යන්තර මනුෂයයා තුළ පෝෂණය ඇතිවීම සහ ශක්තිමත්වීම සිදු නොවන්නේ නම්, මේ කිසිවකට නිවැරදි ආත්මයකින් සම්බන්ධ විය නොහැකිය.

කාලයකට පෙර අවම වශයෙන් වසර දහයකට පෙර සිට පුරුද්දක් ලෙස උදෑසන ඇඳුම් ඇදගත් පසු යාච්ඤා කිරීමට යොමුවීම මාගේ පුරුද්ද වූයේය. දැන් මම දුටුවේ මා විසින් කළ යුතු වැදගත්ම දෙය නම් දෙවියන් වහන්සේගේ වචනය කියවීමට, එය මෙනෙහි කිරීමට යොමුවී මාගේ සිතට සැනසීමක්, දිරිගැන්වීමක්, උණුසුම් කිරීමක් අවවාදයක් ලබා ගැනීමක් සඳහා යොමුවීමයි. මේ අනුව දෙවියන් වහන්සේගේ වචනය මාර්ගයෙන් එය මෙනෙහි කරන විට මගේ හදවත ස්වාමීන් වහන්සේ සමඟ අත්දැකීම් සහිත සහයෝගීතාවයකට ගෙන එන බව දුටුවෙමි. එබැවින් මම නව ගිවිසුම ගැන මුල සිට මෙනෙහි කිරීමට පටන් ගතිමි. දෙවියන් වහන්සේගේ වටිනා වචනයෙන් ස්වාමීන් වහන්සේගේ ආශිර්වාදයේ වචන කිහිපයක් ඉල්ලා සිටි මම කළ පළමු දෙය නම් දෙවියන් වහන්සේගේ වචනය ගැන මෙනෙහි කිරීමට පටන් ගැනීමයි. සෑම පදයක්ම සෝදිසි කරමින් එයින් ආශිර්වාදයක් ලබා ගැනීමටවත්, දේව වචනයේ මම මෙනෙහි කළ දෙය ප්‍රසිද්ධියේ දේශනා කිරීමටවත් නොව, එය මෙනෙහි කරනු ලැබුවේ මගේ ආත්මයට ආහාර ලබා ගැනීම සඳහාය.

නියත වශයෙන්ම එහි ප්‍රතිඵලය වූයේ මෙයයි. මිනිත්තු කිහපයකට පසු මාගේ ආත්මය පාපොච්චාරණයට, ස්තුති කිරීමට, මැදහත්කාරකම් කිරීමට හෝ කන්නලව් කිරීමට යොමුවූයේය. ඒ නිසා මම භාවනාවට (මෙනෙහි කිරීමට) මිස යාච්ඤාවට යොමු නොවුනත් එය ඉක්මනින් අඩු වැඩි වශයෙන් යාච්ඤාවක් බවට පත් විය. මෙසේ මම ටික වේලාවක් පසුතැවිලි වෙමින්, මැදහත්කාරකම් කරමින්, කන්නලව් කරමින්, ස්තුතිවන්ත වෙමින්, මම ඊළඟ පදය වෙත යොමුවෙමි. එවිට එය මා වෙනුවෙන් හෝ අන් අය වෙනුවෙන් මඟපෙන්විය හැකි පරිදි කරන යාච්ඤාවක් බවට පත්කරන්නෙමි. නමුත් තවමත් මගේ මෙනෙහි කිරීමේ පරමාර්ථය මගේ ආත්මයේ පෝෂණය උදෙසා බව මා ඉදිරියේ තබා ඇත.

එහෙයින් මාගේ පෙර තිබූ පුරුද්ද සහ වර්තමාන මාගේ පුරුද්ද අතර වෙනස මෙයයි. කලින් මම නැගිටුණු විට හැකි ඉක්මනින් යාච්ඤා කිරීමට පටන් ගත් අතර. සාමාන්‍යයෙන් මගේ මුළුකාලයම උදෑසන ආහාර දක්වා යාච්ඤාවෙන් සෑම විටම පාහේ ගත කළෙමි. මාගේ ආත්මය සාමාන්‍යයෙන් වදවී ඇති බව මට හැඟුණ විට හැර සෑම අවස්ථාවකදීම මම නොවරදවාම යාච්ඤාවෙන් ආරම්භ කළෙමි. එහිදී යාච්ඤාවට පෙර දෙවියන් වහන්සේගේ වචනය ආහාරය හෝ ප්‍රබෝධමත්වීම සඳහා හෝ අභ්‍යන්තර මනුෂ්‍යයාගේ පිඹීදීම සහ අළුත් කිරීම සඳහා කියෙව්වෙමි. නමුත් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද .. ? සැනසීම දිරිගැන්වීම, ආත්මය නිහතමානිවීම යනාදී දේ ලබා ගැනීමට පෙර විනාඩි පහළොවක්, පැය භාගයක් හෝ පැයක් දණින් වැටී ගත කළෙමි. බොහෝ විට පළමු විනාඩි දහය හෝ පහළොව ඉබාගාතේ ගමන් කරන්නාක් මෙන් වේදනාවෙන් සිටි අතර ඇත්තටම යාච්ඤා කිරීමට පටන් ගත්තේ ඉන්පසුවය. දැන් මගේ හදවත පෝෂණය වන නිසා ඒ ආකාරයෙන් දුක් විඳින්නේ නැත තරම්ය. එමෙන්ම දෙවියන් වහන්සේ සමඟ අසුරු කිරීමේ අත්දැකීමට මාව ගෙන එන නිසා උන්වහන්සේගේ වචනයෙන් මා ඉදිරියට ගෙනා දේවල් ගැන මම කථා කරමි. මම මේ කාරණය ගැන ඉක්මනින් නොදැකීම පිළිබඳව පුදුමයට පත්ව සිටියෙමි. දෙවියන් වහන්සේගේ වචනය ඔබගේ මුළුහදවතින්ම පිළිගන්නා තෙක් ගීතාවලිය 119 නැවත කියවා එය තේරුම් ගැනීමටත්, එහි නියෝග ඔබගේ ජීවිතය තුළ ක්‍රියාත්මක කිරීමටත්, ඔබට උගන්වන පිණිස දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.

## වචනය සහ යාච්ඤාව

***"මම බොහෝ සේ ජීවිතයෙවි. ස්වාමිනී...., ඔබගේ වචනය ප්‍රකාර මා ප්‍රාණවත් කළ මැනව."*** (ගීතාවලිය 119:107) යාච්ඤා කිරීම සහ දේව වචනය වෙන් කළ නොහැකි අතර ඇතුල් කාමරයේ නිහඬ කාලය තුළ සෑම විටම එකට යා යුතුය. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ වචනයෙන් මට කථා කරන සේක. යාච්ඤාවෙන් මම දෙවියන් වහන්සේට කථා කරමි. සැබෑ ඇසුරක් ඇතිවී මට නම් දෙවියන් වහන්සේ සහ මම යන දෙපාර්ශවයම සහභාගි විය යුතුය. මම දෙවියන් වහන්සේගේ වචනය භාවිතා නොකර හුදෙක් යාච්ඤා කරන්නේ නම් මම මගේම වචන සහ සිතුවිලි පමණක් භාවිතා කරන්නෙමි. එහෙත් දෙවියන් වහන්සේගේ සිතුවිලි උන්වහන්සේගේ වචනයෙන් ගෙන උන්වහන්සේ ඉදිරියෙහි ඉදිරිපත් කරන විට එය සැබවින්ම යාච්ඤාවට බලය ගෙනදෙනු ලබයි. එවිට දෙවියන් වහන්සේගේ වචනයට අනුව යාච්ඤා කිරීමට මට හැකියාව ලබාදෙන සේක. සියලුම සැබෑ යාච්ඤාවන් සඳහා දෙවියන් වහන්සේගේ වචන කොයිතරම් අවශ්‍යද ?

කිතුණුවනි...., මෙම පාඩම ඉගෙන ගන්න. දෙවියන් වහන්සේගේ වචනය තුළ සෑම දිනකම ඔබගේ ශක්තිය අළුත්කර ගැනීමට සහ උන්වහන්සේගේ කැමැත්තට අනුව යාච්ඤා කිරීමට යොමුවන්න. එවිට අපගේ යාච්ඤාව අනිත් පැත්තට හැරෙන්නේය. දෙවියන් වහන්සේගේ වචනය කියවන විට අපට යාච්ඤා කිරීමට අවශ්‍ය වන්නේය. දෙවියන් වහන්සේගේ වචනය තේරුම් ගැනීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන වචනය දැන ගැනීමට සහ භාවිතා කිරීමට හැකි වන ලෙස යාච්ඤා කිරීමට දෙවියන් වහන්සේ උගන්වන සේක. ක්‍රිස්තුස් වහන්සේ සියල්ල තුළ සිටින බව වචනයෙන් මට පෙනෙනු ඇත. සියල්ල මා තුළ පවතිනු ඇත.

ආශිර්වාදලත් ඇතුල් කාමරය තුළ දී මට වචනයෙන් සහ යාච්ඤාවෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ වෙතට ළඟාවීමට හැකිය. එහිදී දෙවියන් වහන්සේ වෙතට සහ උන්වහන්සේගේ සේවයට මට යොමු විය හැකි අතර ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ශක්තිමත් කරනු ලබන සේක. එවිට උන්වහන්සේගේ ප්‍රේමය මගේ හදවතේ වගුරවනු ලබන සේක.

## වැදගත් දැන්වීමක්...

**පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.**

**මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.**

**අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම වේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.**

**ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.**

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.